

2021 මාර්තු
03 කාණ්ඩය 01 කලාපය
ISSN 25792369
ආධාරය රු:50/-

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට



# එකම පේළියේ වෙනස් අකුරු (විද්‍යාව, මිත්‍යාව)



මෙම රූපයෙන් දැක්වෙන්නේ ඉතියෝපියාවේ උස්බිම්වල පිහිටි කුඩා නගරයක් වන ලලිබෙලා වෙත වන්දනා චාරිකා කරන වන්දනාකරුවන්ගෙන් වඳභාවයට පත්ව ඇති වන්දනාකාරියක බව්තීස්ම තටාකයේ කඹයකින් පූජකයන් විසින් රඳවාගෙන සිටිමයි. ශුද්ධ ජලය සාරවත් බැවින් ඇයට පිළිසිඳගැනීමට ඉඩ සලසන බව ඔවුන්ගේ විශ්වාසයයි, ඇදහීමයි.

ශාකයක ඵල හට ගැනෙන්නේ ශාකය තුළ සිදුවන ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලියෙනි. එයට හිරුඑළිය, ජලය හා කාබන්ඩයොක්සයිඩ් ප්‍රධාන වශයෙන් අවශ්‍ය වේ. මෙලෙසටම විද්‍යාත්මක ක්‍රමවේදයක් තුළ සත්වයන්ගේත් ඵල හටගැනීම නැත්නම් වර්ගයා බෝ කිරීම සිදුවේ. මිනිස් ඵලයක් හටගැනෙන්නේ ශුක්‍රාණුවක් ඩිම්බයක් සමඟ සංසේචනය වූ විටයි. මෙය විද්‍යාවයි, යථාර්ථයයි.

හුදෙක් මිත්‍යාව අභිමුව සත්‍යය සියල්ල අමතක කර දමා, තම අසමත්කම, දුර්වලතාවය, දුෂ්කරතාව ඉතා පහසුවෙන් වසාදමා අත පිසදාගන්නට මිනිසා පුරුදුව සිටියි. පවතින ධනපති පාලනය එය සිය කූට අරමුණු, අවශ්‍යතා ඉටුකරගැනීම වෙනුවෙන් අතකොළුවක් බවට පත්කරගනී. කාලි මෑණියන් කැන්දන් එන්නේද, මුට්ටි ගඟට දමන්නේද, නාග රජු වැඩමවන්නේද, පැණි පොවන්නේද සැබෑ ප්‍රශ්නය වසන් කිරීමටයි. හුදෙක් මෙය අවබෝධ නොකරගන්නා තාක්කල් ඔහු හෝ ඇය මෙම ධනපති පාලනයේ අතකොළුවක්ම පමණි.

# ලංකාවේ පළමු අධිරාජ්‍ය විරෝධී සටන්කරුවා

# කැප්පෙටිපොළ



පෙබරවාරි මාසය උදාවීමත් සමඟ අපට අසන්නට ලැබෙනුයේ සැබෑ නොවූ නිදහසක් වෙනුවෙන් හඬ නගන නාඩගම්ය. විවිධ මාධ්‍ය උපයෝගී කර ගනිමින් මාධ්‍ය සංදර්ශනය. එවන් පසුබිමක සැබෑවටම සිටි අධිරාජ්‍ය විරෝධී ස්වදේශික සටන්කරුවන් පිළිබඳව ඕනෑ තරම් නිදසුන් අපට හමුවන අතර අපගේ කතානායකයා වන කැප්පෙටිපොළද එවන් පසුබිමක් ඇති සටන්කරුවෙක්ය. ඔහු කලක් බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදීන්ගේ ඌවේ මහ දිසාවේය. මෙරට හමුවෙන සුවිශේෂී කාන්තා චරිතයක් වන ඇහැලේපොළ කුමාරිහාමි යනු ඔහුගේ සොහොයුරියයි.

1815 දී බ්‍රිතාන්‍යය විසින් ලංකාව සම්පූර්ණයෙන්ම යටත් කර ගැනීමත් සමඟ ස්වදේශික ජනතාව වෙත පැමිණි පීඩනය අතිමහත්ය. විවිධ බදු පනත් හා ආහාර හිඟකම හේතුවෙන් පීඩිතයන් තවත් පීඩාවට පත්වූ අතර පීඩිතයන්ගේ පීඩනය අධිරාජ්‍ය විරෝධී සටනක් බවට පරිවර්තනය විය. බ්‍රිතාන්‍යය අධිරාජ්‍යවාදීන් පවා පුදුමයට පත්කිරීමට තරම් ඔවුන්ගේ සටන් ප්‍රබල විය. එවන් මොහොතක බ්‍රිතාන්‍යයන් විසින් ස්වදේශික සටන් මර්දනය කිරීම සඳහා ඌවේ මහ දිසාව ලෙස සිටි කැප්පෙටිපොළ යොදාගැනීම සිදුවිය. මෙහිදී කැප්පෙටිපොළ අධිරාජ්‍යවාදීන්ට එරෙහිව ස්වදේශික සටන්කරුවන්ට එකතු වන අතර ඔහු ස්වදේශික සටන්කරුවන් සමඟ එක්වී අධිරාජ්‍යවාදීන්ට දරුණු ප්‍රහාර එල්ල කරන්නට විය. මෙහි අතුරුඵලයක් ලෙස අධිරාජ්‍යවාදීන් විසින් කැප්පෙටිපොළ ඇතුළු ස්වදේශික සටන්කරුවන් 'රාජද්‍රෝහීන්' ලෙස නම් කරන අතර ඔවුන් සතු දේපළද රාජසන්තක කරන ලදී. මෙම කාලය වන විට දිවයින පුරා පැතිර ගිය උණ වසංගතයක් හමුවේ ස්වදේශික සටන්කරුවන් විශාල ලෙස රෝගයට ගොදුරු වේ. ඒ අතර ස්වදේශික ජාතීන්ගෙන් සිදුවෙන පාවාදීම්ද හමුවේ අධිරාජ්‍ය විරෝධී සටන පරාජය වන අතර කැප්පෙටිපොළ ඇතුළු සටන්කරුවන් අත්අඩංගුවට ගෙන හිස ගසා මරාදමනු ලබයි.


අධිරාජ්‍ය විරෝධි සටනක දී කැප්පෙටිපොළගෙන් ගත හැකි ආදර්ශයන් බොහෝය. ඔහු කිසිවිටෙක ආධිරාජ්‍යවාදීන් ඉදිරියේ දණින් වැටී නිදහස නොඉල්ලා සිටි අතර සෘජු තීරණ, විශිෂ්ඨ නායකත්වය ඔහුගෙන් මනා ලෙස පිළිබිඹු විය. තම හිසට අසිපත් පහර එල්ල වන මොහොතක දී පවා මරණයට බිය නොවූ ඔහු ඝාතකයාට නිවැරදි ලෙස අසිපත් පහර හිසට එල්ල කරන ලෙස පැවසීමට තරම් නිර්භය විය.

2005 වසර තරම් මෑත කාලයක් දක්වා කැප්පෙටිපොළ වන් අධිරාජ්‍ය විරෝධී ස්වදේශික සටන්කරුවන්ට දේශද්‍රෝහී ලේබලය යටතේ සිටීමට සිදුවූයේ මෙරට පාලකයින් විසින් දේශපාලනික නිවැරදි තීන්දු නොගැනීම නිසාවෙනි. 2005 වසරේදී එය නිවැරදි කිරීම සඳහා එවකට සංස්කෘතික ඇමැති වූ විජිත හේරත් සහෝදරයාගේ මැදිහත්වීම සිදුනොවන්නට අදටත් ඔවුන් දේශද්‍රෝහීන්ය.

'නිදහසින්' වසර 73ක් ගත වුවද සැබෑ නිදහසක් සැමරීම තවමත් සිහිනයක් වී ඇත. එනිසා අධිරාජ්‍ය විරෝධී සටන අදටත් වලංගුය. එවන් පසුබිමක ඉතිහාසයෙන් ඉගෙනීමට ඕනෑවටත් වඩා පාඩම් ඇත.

# අධිරාජ්‍ය විරෝධී, දේශප්‍රේමී අරගල මර්දනය කිරීමට, මෙම පාලක කල්ලි අධිරාජ්‍යවාදීන් සමඟ අත්වැල් බැඳගෙන

*ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා සමඟ කළ සංවාදය*



### නිදහස දිනාගෙන වසර 73ක් පසුකර ඇතත් අපි සැබෑ නිදහස භුක්ති විඳිනවාද?

මේ පෙබරවාරි 04ට ලංකාවට නිදහස ලැබිලා වසර 73ක් වෙනවා. ඒත් අපේ රටට, ජනතාවට තවමත් සැබෑ ලෙසම නිදහස ලැබිල නැහැ. රාජ්‍ය නායකයෝ පෙබරවාරි 04 මොන පම්පෝරි ගැහුවත් තමවත් ලංකාව සැබෑ ලෙසම නිදහස භුක්ති විඳින්නේ නැහැ.

1948දී ඇත්තටම සිදුවුණේ එතෙක් සෘජු යටත් විජිතයක් ලෙස පැවති අපේ රට නව යටත් විජිතයක් බවට පත්වීමයි. ලංකාවට සැබෑ ලෙසම නිදහස දෙනවා වෙනුවට බ්‍රිතාන්‍යයන් 1948දී උපක්‍රමශීලීව තමන්ට අවනත, තමන්ට ගැති ලාංකේය ප්‍රභූ පන්තියට බලය පැවරුවා. බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආර්ථික සමාජ ක්‍රමය එලෙසම පැවතුණා. ඒ විතරක් නෙවෙයි, 1972 වනතුරුම ලංකාවේ රාජ්‍ය නායකත්වය බ්‍රිතාන්‍ය අත තබා ගත්තා. ලංකාව සැලකුනේ බ්‍රිතාන්‍ය කිරීටයට අයත් රටක් ලෙස. 1971 අරගලයට සම්බන්ධ තරුණයන්ට නඩු පැවරීමේදී 'මහ රැජිණගේ ආණ්ඩුවට එරෙහිව කුමන්ත්‍රණය කිරීම' ලෙස චෝදනා ඉදිරිපත් කිරීමෙන්ම එය පැහැදිලියි.

1972 ජනරජ ව්‍යවස්ථාව මඟින් බ්‍රිතාන්‍ය සමඟ පැවති නිල බැඳීම අහෝසි කළත් 1978 විවෘත ආර්ථිකය හෙවත් නව ලිබරල්වාදය හඳුන්වාදීමත් සමඟ ලංකාව නැවත අධිරාජ්‍යවාදී හා විදේශ බලවතුන්ගේ බලපෑමට යටවුණා. 78න් පසු ලංකාව එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ආර්ථික, දේශපාලන හා යුධ උපාය මාර්ග යට නතු වුණා. ඒ වගේම ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන යොදා ගත්තා. 70, 80 දශකවල අසල්වැසි ඉන්දියාව සිටියේ එක්සත් ජනපද විරෝධී දේශපාලනයක. ඒ නිසාම ලංකාව එක්සත් ජනපදයට අවනත වන විට ඊට එකට එක කිරීමක් ලෙස ඉන්දියාවද ලංකාවට මැදිහත් වුණා. 1987 ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළේ එලෙසයි.

1990 දශකයෙන් පස්සේ ආසියානු කලාපයේ චීනය බලවත් වුණා. ණයගැනීම වෙනුවෙන් ලංකාව චීනය දෙසට ගියා. මේ වන විට ලෝක බලතුලනය වෙනස්වෙලා ඉන්දියාව එක්සත් ජනපදය හා මිත්‍ර, චීන විරෝධී ස්ථාවරයකට ආවා. ඉන්පසු ලංකාව තුළ එන බලපෑම්වලට එරෙහිව එක්සත් ජනපද සහයෝගයද සහිතව ඉන්දියාව අපේ රටට බලපෑම් කරන්න ගත්තා. පසුගිය කාලයේ සිදුවූ ආණ්ඩු පෙරළි, අභ්‍යන්තර ජාතිවාදී ගැටුම් පිටුපසත් මේ දේශපාලනය තිබුණා.

මීට අමතරව ලෝකයට ණයවීම නිසා, ණයට හිලව් ලෙස ලංකාවේ ඉඩම්, වරාය ඇතුළු සම්පත් විදේශ රටවලට දීමට පාලකයින් කටයුතු කළා. තවමත් එය කරනවා. මේ සියලු කරුණු දෙස බලනවිට පැහැදිලි වෙන්නේ ලංකාව තවමත් සැබෑ ජාතික නිදහස දිනා නොගත් රටක් බවයි.

බ්‍රිතාන්‍ය පාලනයේ අවසන් කාලයේ ලාංකීය ධනපති පංතිය ජාතික සංගම් හදාගත්තට ජාතික නිදහස වෙනුවෙන් අරගලයක් කළේ නැහැ. ඉන්දියාවේ පැවති තරමේ හෝ ජාතික නිදහස් අරගලයක් ලංකාවේ තිබුණේ නැහැ. ඒ වෙනුවට 'නිදහස' පිනට ලැබෙනකම් බලාසිටියා, ඒ වගේම සැබෑ අධිරාජ්‍ය විරෝධී, දේශප්‍රේමී අරගල මර්දනය කිරීමට මෙම පාලක කල්ලි අධිරාජ්‍යවාදීන් සමඟ අත්වැල් බැඳගත්තා. ඒක තමයි ඇත්ත.

### ජ.වි.පෙ. ගොඩනැගීමේ මූලික පදනම කුමක්ද? ඒ පදනම වටා විශේෂ පක්ෂ සංස්කෘතියක් තියෙනවා නේද? ඔවුන්ගේ ජීවනෝපාය හා පැවැත්ම අනිත් පක්ෂවලින් වෙනස්වන්නේ කොහොමද?

1965දී ජ.වි.පෙ. ගොඩනැගෙන්නේ සමාජවාදී සමාජ විප්ලවය අරමුණු කරගත්, විප්ලවකාරී වමේ ව්‍යාපාරයක් විදිහට. ඒ වන විට රටේ පැවති පැරණි වම විසින් වම පාවාදීමත්, ධනවාදයේ අර්බුදයත්, ලෝක දේශපාලනයේ ප්‍රතිවිරෝධයත් ජ.වි.පෙ. ගොඩනැගීමට විෂයමූලික ලෙස බලපෑවා. ජවිපෙ අරමුණ මේ පසුගාමී ධනවාදය වෙනුවට ලංකාවේ සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීමයි. ලංකාවට සැබෑ ආර්ථික, දේශපාලන, සමාජීය හා සංස්කෘතික නිදහස දිනාගැනීමත් ඒ තුළ අඩංගු වෙනවා. ඒ නිසාම ජවිපෙ එක් අර්ථයකින් විමුක්ති ව්‍යාපාරයක්ද වෙනවා. ජාතික නිදහස් අරගලය හරහා සමාජවාදය දිනාගැනීමේ උපාය මාර්ගය ජ.වි.පෙ. තෝරාගන්නේ මේ නිසයි.

අපේ පක්ෂය ලංකාවේ අනෙක් පක්ෂවලට වඩා වෙනස්. අපි ස්වේච්ඡාවෙන් වැඩකරන ව්‍යාපාරයක්. වෘත්තීය විප්ලවවාදීන් විසින් නායකත්ව කාර්යභාරය දරන ව්‍යාපාරයක්. කැපකිරීම, පරිත්‍යාගය, ආදර්ශය, සහෝදරත්වය, අපේ දේශපාලන සංස්කෘතියේ පදනම් ලෙස පවතිනවා. අපේ පක්ෂය එකම අරමුණකින් එක්ව බැඳුණු විශාල පවුලක් වගේ සංවිධානයක්. පෞද්ගලික බලාපොරොත්තු නැතිව, ප්‍රතිලාභ අපේක්ෂාවෙන් තොරව වැඩකරන, අනාගතය නියෝජනය කරන පිරිසක් ලෙස අපි වැඩකරනවා. අපේ පක්ෂයේ මේ විශේෂ සංස්කෘතිය නිර්මාණය වෙලා තියෙන්නේ ඒ පදනම මත. මේ සඳහා ආරම්භයේදී රෝහණ සහෝදරයා ඇතුලු තරුණ විප්ලවවාදීන් දුන් ආදර්ශය ඉතා වැදගත්.

### ලංකාව ලෝක බලවතුන්ගේ ගොදුරක් බවට පත්වෙමින් යනවා. මෙහි තිබෙන බරපතලකම පැහැදිලි කළොත්?

ඔව්. මේ වනවිට ලංකාව ලෝක බලවතුන්ගේ බල අරගලයේ ගොදුරක් බවට පත්ව තියෙනවා. මෙය ඉතාම බරපතලයි. වර්තමානයේ අපේ කලාපය තුළ ආර්ථික වශයෙන් චීනය බලවත් වෙලා තියෙනවා. ඒ නිසා ඔවුන් මේ කලාපය තුළ හා අප්‍රිකාවේ පවා තම වෙළඳ හා ව්‍යාපාර කටයුතු පුළුල් කරමින් ඔවුන්ගේ ආර්ථික ආධිපත්‍ය තහවුරු කරමින් ඉන්නවා. චීනය සමාජවාදී රටක් ලෙස පැවතුනාට එහි පිරිහීම් රැසක් තියෙනවා. විශේෂයෙන් විදේශ ප්‍රතිපත්තියේදී ඔවුන් වෙළඳපොළ ආර්ථිකයට අනුව කටයුතු කරනවා. මෙහිදී මේ කලාපය තුළ ආර්ථික, දේශපාලන ආධිපත්‍ය සඳහා චීනය හා ඉන්දියාව අතර ප්‍රතිවිරෝධයක් තියෙනවා. ඉන්දීය සාගර කලාපය තුළ චීනය බලවත් වෙනවට ඉන්දියාව කැමති නැහැ. එක්සත් ජනපදයත් චීනය සමඟ ප්‍රතිවිරෝධයක ඉන්නේ. දැන් එක්සත් ජනපදය හා ඉන්දියාව මිතුරන් ලෙස කටයුතු කරනවා. ඒ නිසා ඉන්දියාව එක්සත් ජනපදයේ සහායද සමඟ මේ කලාපයේ චීන ආධිපත්‍යයට එරෙහිව තරඟ වදිනවා.

මෙම තරඟයට තමයි ලංකාව මැදිවෙලා ඉන්නේ. ලෝක දේශපාලනයේ හෝ කලාපීය භූ දේශපාලනයේ හැසිරීම වටහානොගත් අපේ රටේ පාලකයන් තම බැරිකම, නිවටකම හා ආර්ථික දැක්මක් නැතිකම නිසා පසුගිය කාලයේ චීනයට සමීප වී ණය ගත්තා. ණයට හිලව් ලෙස විශාල ඉදිකිරීම්වල කොන්ත්‍රාත් චීනයට දුන්නා. චීන ණයක් අරගෙන හදපු හම්බන්තොට වරාය 99 අවුරුදු බද්දට චීනයට දුන්නා. කොළඹ, චීනය මැදිහත්ව පෝට්සිටිය හදනවා. මෙයට ඉන්දියාව කැමති නැහැ. ඒ නිසා ඔවුන් අපේ රට තුළ ඔවුන්ගේ බලය තහවුරු කිරීමට බලපෑම් කරනවා. එහි ප්‍රතිඵලය තමයි කොළඹ වරායේ නැගෙනහිර පර්යන්තය ඉන්දියාවට දෙන්න සිදුවෙන්නේ. ත්‍රිකුණාමලය තෙල් ටැංකිවලටත් ඉන්දියාව අයිතිය කියනවා. මේ තත්වය මත ලංකාව කලාපීය බලවතුන්ගේ කෙළිබිමක් හා ගොදුරක් වෙලා තියෙනවා. මඩිතරකර ගැනීම එකම අරමුණ කරගත්, ආර්ථික, දේශපාලන දැක්මක් නැති, නිවට, පරාධීන පාලකයන් ලංකාව මෙම බල අරගලයට ගොදුරු කරලා තිබෙනවා. මෙය ඉතාම බරපතල හා හානිදායක ප්‍රතිඵල

14 පිටුවට

FORWARD

සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත

464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.

Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

# නිදහස බලගන්වමු!!

පෙබරවාරි තරුණයන්ට වැදගත් මාසයකි. ජීවිතයේ බොහෝ පාඩම් නැවත නැවතත් ඔප්පු කරදෙන මාසයකි. එක් පැත්තකින් ගත්විට නිදහස දිනාගත් මාසයයි. අනෙක් පැත්තෙන් ආදරවන්තයින්ගේ දිනය උදාවන මාසයයි. මේ අවස්ථා දෙකේම නිදහස පිළිබඳව සංවාදයක් තරුණයන් තුළ අවශ්‍ය කාලයකි.

පෙබරවාරි 4 'නිදහස' උත්කර්ෂයට නංවනු ලබන දිනයකි. මේ සමරන්නේ "කාගේ නිදහසද?" මුළුමහත් රටවැසියාගේ නිදහස ද? නැතිනම් පාලකයන්ගේ නිදහසද? යන්න සිතා බැලිය යුතු වේ.

අප යටත්විජිතවාදීන්ව දුටුවේ වර්ණයෙන් වෙනස්, ඇඳුමෙන් පැළඳුමෙන් වෙනස්, භාෂාවෙන් වෙනස්, හැසිරීමෙන් වෙනස් "පේන සතුරෙක්" ලෙස ය. එම සතුරා අපගේ නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය උදුරා ගත්හ. දේපළවල අයිතිය තමන් සතු කරගත්හ. අධ්‍යාපනයේ අයිතිය අහිමි කළහ. රටේ සම්පත් කොල්ලකමින් ජනතාව පීඩාවට පත් කළහ. බදු පිට බදු පැනවූහ. සුද්දාට බැලමෙහෙවරකම් කළවුන්ට දොළ පිදේනි දුන්හ. රට පාවාදෙන්නන් ආරක්ෂා කළහ. කැලෑ කැපූහ. වන සතුන් මැරූහ. රටට ආදරය කළවුන් මර්ධනය කළහ. රටට ද්‍රෝහීවන්නන් ආරක්ෂා කළහ. සුද්දාගේ ක්‍රියාකලාපය විවේචනය කරමින් ඊට එරෙහිව සටන් කළ උන් මර්ධනය කළහ, රාජද්‍රෝහීන් ලෙස නම් කළහ. ඒ කෙසේ වුවත් පේන සතුරාට විරුද්ධව එදා ජනතාව ඒකරාශී විය. ඔවුන්ව පන්නා දැමිය යුතු යැයි අදිටන් කරගත්හ. ඒ වෙනුවෙන් දිවි පුදා සටන් කළහ. නිදහස දිනා වසර හැත්තෑ තුනක් ගත වුවද, එදා සුද්දා අපව යටත් කළ කාලයටත් වඩා සුද්දාගේ ක්‍රියාකලාපය අද සිදුවෙමින් පවතී. නමුත් ජනතාවට පෙනෙන්නට 'සතුරෙක්' නැත. අපේම පාට, අපේම බස, අපේම ඇවතුම් පැවතුම් වලින් යුතු කලු සුද්දා විසින් යටත්විජිත යුගයටත් වඩා වර්තමානයේදී ජනතාව තලා පෙළමින් සිටී.

එනම්, වසර හැත්ත තුනකට පසුවත් අප මේ සමරන්නේ මේ "නොපෙනෙන සතුරාගේ" නිදහසේ අයිතියයි.

සැබෑ නිදහස දිනාගැනීමට නම්, මේ නොපෙනෙන සතුරා විසින් වසර හැත්තෑ තුනක් තිස්සේ අපෙන් අහිමි කරගන්නා ලද නිදහස සමස්ත ජනතාව වෙනුවෙන්ම ලබාගැනීමට, අපේම වූ නිදහසක් වෙනුවෙන් අරගලය තෝරා ගත යුතු කාලය එළඹ ඇත. එවිට ඔබ රාජද්‍රෝහී වෙනු ඇත! අධිරාජ්‍යවාදී ගැත්තෙක් වනු ඇත!! සංස්කෘතිය විනාශකරන්නෙක් වනු ඇත!!! රට-ජාතිය පාවාදෙන්නෙක් වනු ඇත! දේශීය සම්පත් විනාශ කරන්නෙක් වනු ඇත!! එත් ඔවුන් ඒ සියල්ල කරනු ලබන්නේ සැබෑ නිදහස ඉල්ලා කරනු ලබන ජනතාව දුර්වල කිරීමටය, ජනතාවගේ සැබෑ නිදහස අහිමි කිරීම වෙනුවෙන් ය.

යටත්විජිතවාදීන්ගෙන් මෙන්ම දේශීය පරගැති පාලකයන්ගෙන් ඊට වඩා යමක් බලාපොරොත්තු විය නොහැක. මන්ද, ජනතාව යටත් කරගෙන සිටින උන්ගේ අරමුණ එකක් වන බැවිනි. එබැවින් අපේ නිදහස, ජනතාවගේ නිදහස වෙනුවෙන් අත්නොහැර සටන් කරමු! හැත්තතුන්වෙනි නිදහසින් පසුව සමරන නිදහස "ජනතාවගේ සැබෑ නිදහස් සැමරුම" බවට පත් කරමු...!!

**පෙබරවාරි 2**

## සුභ ගමන් සහෝදරයා....



කෝවිඩ් 19 වසංගත තත්වය නිසා පළමුවරට ලංකාවේ වෛද්‍යවරයෙක් පසුගියදා මිය ගියා. ඔහු ළමා රෝග පිළිබඳ වෛද්‍යවරයෙක්. ඔහුගේ මියයෑම පිළිබඳ බුකියේ බොහෝ පිරිසක් කම්පා වුණා. ඒ අතර ෂෙයාර් වුණු විශේෂ පෝස්ටුවක මෙසේ සඳහන් වී තිබුණා. "මම නම් මේ සහෝදර වෛද්‍යවරයාට නිවන් සැප පතන්නේ නෑ. ඔහුත් මේ කෝවිඩ් 19 කළමණාකරණ යාන්ත්‍රණය දේශපාලනීකරණය කිරීම නිසා ඊට ගොදුරු වුණ අසරණ සෞඛ්‍ය සේවකයෙක්. අසරණ මිනිස්සු විරුවො කරලා මරු කටට යවලා නිවන් පතල අත පිහිදගන්න උපන් හපන් ජාතියක් අපි. අසාධ්‍ය රෝගීන් කළමණාකරණය කරගන්න අවශ්‍ය යටිතල පහසුකම්, දියුණු මානව සම්පත් සහ මුදල් සාධාරණ විදිහට යොදාගත්තද කියලා පපුවට තට්ටු කරලා තමන්ගෙන්ම අහල බලන්නයි තියෙන්නේ දැන්. මිත්‍රයා, දැන්ම නිවන් දකින්න හිතන්න එපා. ඔබේ මරණයට වගකිවයුතු අය පෝලිමේ ඒවි. උන්ගේ කනට එකක් ගහලා "ඔබට සතුටුයිද දැන්?" කියලා අහන්න බලාපොරොත්තුවෙන් ඉන්න." "මම තමයි ලෝකේ හොඳටම කෝවිඩ් මර්දනය කළේ" කියපු ජනාධිපතිතුමාගෙන් අහන්න තියෙන්නේ මේකද ඔබේ කළමණාකරණය කියලා තමයි.

**පෙබරවාරි 2**

## නැගෙනහිර ජැටිය දේශප්‍රේමියි, බටහිර ජැටිය එහෙම නැහැ



කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉන්දීය අදානි සමාගමට දීමට විරුද්ධව විශාල විරෝධයක් රට පුරා මතු වුණා. ජවිපෙ එහි ප්‍රමුඛ කාර්යයක් සිදුකළා. ඒවගේම මේ ආණ්ඩුව බලයට ගෙනඒමට දරදිය ඇදපු ස්වාමින්වහාන්සේලා සහ ආණ්ඩු හිතවාදී වෘත්තීය සමිතිත් මෙම විරෝධයේ සිටියා. අවසානයේ ගෝඨාබය ආණ්ඩුවට රටේ පැනනැගූ දැඩි විරෝධය නිසා වරාය විකිණීම අඩියක් පස්සට ගත්තා. ඔවුන් පැවසුයේ නැගෙනහිර ජැටිය අපි දෙන්නේ නෑ, එහෙනම් අපි බටහිර ජැටිය ඉන්දියාවට දෙන බවයි. එතැනින්ම මේ සටන නතර කරන්නට මෙම ඊනියා දේශප්‍රේමී නඩය හා ආණ්ඩුවට හිතවත් වෘත්තීය සමිති පියවර ගත්තා. නමුත් ජවිපෙත් එහි වෘත්තීය සමිතිත් තරයේ කියා සිටියේ, නැගෙනහිර හෝ බටහිර ජැටිය විකිණීමට ඔවුන් විරුද්ධ බවයි. ඔවුන් පවසන්නේ, ජාතික සම්පත් විකුණන්නේ නෑ, විකුණුපු වරායත් නැවත පවරා ගන්නවා කියලා ඡන්දය ඉල්ලපු ගෝඨාබය ආණ්ඩුව දැන් රටේ සම්පත් විකුණන්නට පටන්ගෙන ඇති බවයි. ඒවගේම ආණ්ඩුව ගෙන ඒමට දරදිය ඇදපු ස්වාමින්වහන්සේ නමක් වන පූජ්‍ය මුරුත්තේට්ටුවේ ආනන්ද හිමි සඳහන් කළේ "අපි ආණ්ඩුවට සුදු හුණු ගානවා නෙවෙයි, හැබැයි බටහිර ජැටිය බදුදීමට අපි විරුද්ධ නෑ කියලයි." මේ ස්වාමින්වහන්සේට අනුව ගත්තොත් නැගෙනහිර ජැටිය දේශප්‍රේමීයි. බටහිර ජැටිය එහෙම නෙවෙයි.

**පෙබරවාරි 7**

## කැකිල්ලේ කොමිසම




මේ වනවිට ආණ්ඩුව විසින් ගෙන එන ලද ජනාධිපති විමර්ශන විශේෂ කොමිසම සම්බන්ධයෙන් රට තුළ විරෝධයක් එල්ලවෙමින් තිබෙනවා. මේ පිළිබඳ අලුත් පියාපත් සංවිධානය මාධ්‍ය හමුවක් පවත්වමින් තමන්ගේ මතය ප්‍රකාශ කළා. "උසාවිය තුළ විභාගවෙමින් පවතින පැමිණිලි 79ක් පිළිබඳ අවසන් වාර්තාවක් මෙම කොමිසමින් ලබාදී තිබෙනවා. කොමිසමට බලයදී තිබෙන්නේ රජයේ නිලධාරීන්, සංස්ථා නිලධාරීන්, සන්නද්ධ හමුදා නිලධාරීන් හා පොලිස් නිලධාරීන් සම්බන්ධව විමර්ෂණය කරන්නයි. හැබැයි නිදහස් කළ පැමිණිලි අතර එම කාණ්ඩයන්ට අයත් නොවන පුද්ගලයන්ගේ පැමිණිලි, උදාහරණයක් විදියට උදය ගම්මන්පිල මහතා, මහින්ද කඳගම මහතා, නිශ්ශංක සේනාධිපතිතුමා, දුමින්ද සිල්වා මහතා ගන්න පුළුවන්. ඒ නිසා කොමිසම තමන්ට බලය නොලැබුණු කාර්යයක් කරමින් යනවා. ඒ කියන්නේ මේක අධිකරණයට අපහාස කිරීමක් ලෙස ගන්නත් පුළුවන්. ඒ නිසා ආණ්ඩුව තමන්ගේ විරුද්ධ මතදාරීන් දඩයන් කිරීමටත්, තමන්ගේ හිතවතුන් වංචා දූෂණවලින් බේරාගැනීමටත් දරන උත්සාහයක් බව" ප්‍රකාශ කළා. මෙයින් පැහැදිලි වන්නේ ආණ්ඩුව දැන් නීතියෙන් බැරිනම් කැලෑ නීතියෙන් හරි තමන්ගේ බලය පවත්වාගෙන යෑමේ මෙහෙයුමක සිටින බවයි.

**පෙබරවාරි 10**



## ලෝකයේ එකම ගස රැකගැනීම වෙනුවෙන්...

මේ දිනවල මුහුණු පොතේ වැඩිපුරම කතාවෙන මාතෘකාවක් තමයි Crudia zeylancica ගස ගැන. මේ ගස් ලෝකයට තිබෙන්නේ එකයි කියලයි පරිසරවේදීන් කියන්නේ. ඒ නිසාම මෙම ගස රතු දත්ත පොතටත් ඇතුල් කර තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ දාරළුව කියන ගමේ මෙම ගස පිහිටා තිබෙනවා. මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිවෙන නිසා මෙම ගස ලෝකයට අහිමි වෙන්නයි යන්නේ. ඒ නිසා පරිසරවේදිනියක වන දේවානි ජයතිලක මහත්මිය පසුගියදා මේ ගැන රටට හෙළිදරව් කරා. මෙම ගස කැපීමට එරෙහිව පරිසර සංවිධාන හා ප්‍රගතිශීලි ජනතාව තුළින් විශාල විරෝධයක් මතුවෙමින් තිබෙනවා. සමාජවාදී තරුණ සංගමය හා සමාජවාදී භික්ෂු සංගමය එක්ව පසුගියදා මෙම ස්ථානය නිරීක්ෂණය කළා. කෙසේ වෙතත් ලෝකයේ දුර්ලබම ගසේ ආයු කාලය තිබෙන්නේ වත්මන් ආණ්ඩුව අතේ. වත්මන් ආණ්ඩුව පත් වූ සැණින් රට තුළ විශාල පරිසර හානියක් මේ වනවිට සිදුකරමින් සිටිනවා. එවැනි වටපිටාවක් තුළ මෙය ආරක්ෂා කිරීමට පරිසරහිතකාමී මිනිසුන් ඉදිරියට පැමිණිය යුතුයි..

# කොරෝනා මැද ජීවිතය ගැටගසන්නට මං සොයන ජීවිත

ස්වභාවික හෝ වෙනත් කවර හෝ ව්‍යසනයකදී වුව පළමුවෙන්ම සහ වඩාත් පීඩාවට පත්වනුයේ දිළිඳු ජනතාවය. ලෝකයේ කුමන රටකදී වුව එහි වෙනසක් නොමැති බවට සාක්ෂි ඕනෑවටත් වඩා ඉතිහාසය පුරා දැකිය හැකිය. ලෝකයම ගිලගත් කෝවිඩ් 19 වසංගතයෙන්ද ඒ බව වඩවඩාත් තහවුරු වෙමින් ඇත්තේ මෙම වෛරසයට ගොදුරු වූ සහ ගොදුරු වෙමින් සිටින මෙන්ම මියගිය ආසාදිතයන්ගෙන්
බහුතරයද දිළිඳු ජනතාවම වන බැවිනි. එමෙන්ම මෙම ගෝලීය වසංගත තත්වය තුළ ලොවපුරා රැකියා අහිමිවූ ජනතාවගෙන් සාතිශය බහුතරය වන්නේද මෙම වැඩකරන ජනතාවමය. පසුගිය කලාපවල අපි කෝවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත්වූ විවිධ සමාජ කණ්ඩායම් මුහුණපා ඇති ගැටලු ගැන කතාබහ කළ අතර මෙවර කලාපයෙන් අප අවධානය යොමු කළේ එදිනෙදා හමුවෙන කුමන හෝ කුලී වැඩක් සිදුකරමින් ජීවිතය ගැටගසා ගැනීමට වෙර දරන සහෝදර ජනතාව මෙම වසංගත තත්වය හමුවේ මුහුණ පා ඇති දුෂ්කරතා පිළිබඳවය.

නිශ්චිත සංඛ්‍යා ලේඛන නොමැති වුවද මෙරට වැඩකරන ජනතාවගෙන් සැලකිය යුතු ප්‍රමාණයක්, වඩුවැඩ, මේසන් වැඩ, අත්උදව් දීම, තීන්ත ආලේප කිරීම, තණකොළ කැපීම, බඩු ඇදීම, පොල් කැඩීම, ගස්වල අතු කැපීම, නිවෙස්වල ඉවුම් පිහුම් කිරීම, වගාබිම්වල වැඩකර දීම වැනි බොහොදේ දෛනික කුලී පදනම මත සිදුකරති. බොහෝ අවස්ථාවල ඔවුන්ට කුලී රැකියාවක් සොයාගැනීම සඳහා බොහෝදුර ගෙවා යාමට සිදුවන අවස්ථා බහුලය. එවැනි අවස්ථාවල කිසිදු කුලී වැඩක් නොලැබ ආපසු ඒමට සිදුවන අවස්ථා මෙන්ම ඉතා අඩු මුදලකට වැඩකර දීමට සිදුවීමද, දවස් කිහිපයක් ශ්‍රමය ලබාගෙන කුලී මුදලින් කොටසක් පමණක් ලැබීම හෝ මුදල් ලබානොදී මගහැරීමට ලක්වීමද ඔවුන් පොදුවේ මුහුණ දෙන ගැටලු කිහිපයකි. බොහෝවිට මෙවැනි කුලී වැඩ කරන මිනිසුන්ගේ පවුල්වල එකම උපයන්නා ඔවුන් වන අතර එවැනි අවස්ථාවක කුලී වැඩක් නොලැබීම, එම පවුලම කුසගින්නේ සිටීමටද හේතු වේ.
එය දරුවන්ගේ අධ්‍යාපනය කටයුතු අතරමඟ නැවතීමට හෝ පාසල්වලට ඇතුලත් නොකර සිටීමටද බලපා ඇත්තේ ඒ වෙනුවෙන් වියදම් කිරීමට තබා දිනකට එක වේලක් හෝ



දරුවන්ට කන්නට යමක් දීම පවා බොහෝවිට අසීරුවන හෙයිනි.

සාමාන්‍ය තත්වයකදී මෙවැනි ගැටලු රැසකට මුහුණපාන කුලී රැකියා මගින් දිවි ගැටගසාගන්නන් පවතින කෝවිඩ් 19 වසංගතය ඉදිරියේ කබලෙන් ලිපට වැටුණාක් මෙනි. පසුගිය 2020 වසරේ මාර්තු මස සිට මේ දක්වා වරින්වර රට වසා තැබීම හා ඇතැම් ප්‍රදේශ හුදෙකලා කිරීම හේතුවෙන් බොහෝ කුලීවැඩ කරන්නන් හට රැකියා අවස්ථා අහිමි වූ අතර ඒ හේතුවෙන් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් දැඩි අසරණභාවයට පත්ව ඇත්තේ දවසට එක් වේලක් හෝ කෑමට යමක් පවා සපයාගත නොහැකි හෙයිනි.

රුපියල් පන්දහසකින් දෙතුන් දෙනෙකු සිටින පවුලකට පවා මසක් තියා සතියක්වත් ජීවිතය ගැටගසා නොහැකි තරමට ජීවන වියදම ඉහළ නැග තිබියදී, එකී රුපියල් පන්දහසේ දීමනාව පවා නොලැබූ කුලීවැඩ කරන මිනිසුන් ගණන බොහෝය. මන්ද එම දීමනාව ලැබුණේ ස්ථිර පදිංචිය සහිත පවුල්වලට පමණක් වන බැවිනි. රුපියල් පන්දහස හෝ නොලැබූ ඔවුන් වෙනුවෙන් ආණ්ඩුව විසින් මෙතෙක් කිසිදු සහනයක් ලබාදීමක් හෝ එවැනි සූදානමක් පවා පෙනෙන්නට නැත. කොහේ හෝ ගොස් කුලී වැඩක් සොයාගැනීම දැන් වඩාත් දුෂ්කර වී ඇත්තේ වසංගත තත්වය හේතුවෙන් නාඳුනන පුද්ගලයන්ගෙන් සේවාවන් ලබා ගැනීමට බොහෝදෙනා මැලිවී ඇති බැවිනි. ඒ හේතුවෙන් ලැබෙන කුමන හෝ අවස්ථාවක ඉතා අඩු මුදලකට පවා කුලී වැඩ කර දීමට ඔවුන් පෙළඹී සිටින්නේ වෙන කරන්නට කිසිදු දෙයක් නොමැති හෙයිනි. මන්ද කෙසේ හෝ පවුලේ සාමාජිකයන්ගේ කුසගිනි නිවිය යුතු බැවිනි.

එවැනි පවුල්වල අනෙක් බරපතල ඛේදවාචකය වන්නේ ඔන්ලයින් අධ්‍යාපනයයි. එදා වේල අපහසුවෙන් සරිකර ගන්නා එවැනි මිනිසුන්ට දරුවන්ට අධ්‍යාපනය ලබාදීම පවා දුෂ්කර වී ඇති තත්වයක් තුළ ඔන්ලයින් අධ්‍යාපනය යනු සිහිනයකි.

ලෝකයට ණයවී තම නම ගසාගන්නට කුළුණු තනන පාලකයන්ට ඔවුන් විසින් නිර්මාණය කර ඇති සමාජයේ මිනිසුන්ගේ ජීවිතවල දුෂ්කරතාවයන් නොපෙනෙන අතර පෙනුනද ඒ ගැන කතා කරන්නට මතක් වනුයේ මැතිවරණයකදී පමණක්මය. එය ඔවුන්ගේ අවධානයට ලක්නොවීමටද හේතුව අපමය. මන්ද පාලකයින් කුමක් කළද, ඉන් ජනතාව කුමන පීඩාවකට පත්වුවද, ඒ සියල්ල අමතක කොට බත් පැකට් එකට පවා ඡන්දය දීමට පෙළඹී සිටින බහුතර ජනතාව තමා පීඩනයට පත්කරනා එම පාලකයන්වම නැවත නැවතත් තෝරාපත් කර ගන්නා හෙයිනි. එයින් ඔවුන් මුදවාගත හැකිවනුයේ ඔවුන්ට සත්‍ය වටහාදීමෙන් පමණක් වන අතර එය කළ හැකිවනුයේ ඔවුන් අතරට ගොස් ඔවුන්ට සත්‍ය වටහාදීමෙන් පමණක්මය. එය කිසිසේත් පහසු ඉලක්කයක් නොවන අතරම කිසිසේත්ම අත්හැරිය නොහැකි සමාජ වගකීමක්ද වේ.

**රුපියල් පන්දහසකින් දෙතුන් දෙනෙකු සිටින පවුලකට පවා මසක් තියා සතියක්වත් ජීවිතය ගැටගසා නොහැකි තරමට ජීවන වියදම ඉහළ නැග තිබියදී, එකී රුපියල් පන්දහසේ දීමනාව පවා නොලැබූ කුලීවැඩ කරන මිනිසුන් ගණන බොහෝය.**

# නැගෙනහිරින් බටහිරට



**අද අපේ රටේ පාලකයින්, ඉන්දියන් සාගරයේ වටිනාම බිම්කඩ වන ලංකාව මෙම ලෝක බලවතුන්ගේ ආර්ථික යුද්ධයේ යුධ පිටියක් බවට පත්කර හමාරය. එසේ වුයේ අප රටේ පාලකයින් ක්‍රියාත්මක කළ වැරදි ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති නිසාය. එමෙන්ම පාලකයින්ගේ පරගැති, පසුගාමී මනෝභාවයන් ප්‍රයෝජනයට ගෙන ලෝක බලවතුන් අප භූමියේ කොටස් මිලදීගත්තේය.**

පසුගියදා නැගෙනහිර ජැටිය ඉන්දියානු සමාගමකට ලබාදීමට කැබිනට් අනුමැතිය ලැබීමත් සමඟ නැගෙනහිර ජැටිය විකිණීමේ මාතෘකාව රටේ මහත් ආන්දෝලනයකට තුඩු දුන් එකක් විය. ඒ සමඟම වරාය වෘත්තීය සමිති ඒකාබද්ධව නැගෙනහිර ජැටිය සුරැකීමේ පෙරමුණක් ගොඩනැගුණි. මෙම පෙරමුණට වර්තමාන ආණ්ඩුව බලයට ගෙන ඒමට වෙහෙස මහන්සි වුණු සංඝරත්නය සමඟ වෙනත් සංවිධාන හා පුද්ගලයින්ද සම්බන්ධ විය. මෙමඟින් ආණ්ඩුවට එල්ල වූ ප්‍රබල විරෝධය නිසා නැගෙනහිර ජැටිය ඉන්දියානු සමාගමකට නොදෙන බවට අගමැතිවරයාට වාචික පොරොන්දුවක් දීමට සිදුවිය.

නමුත් ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ආණ්ඩුව පොරොන්දු වූ එකඟතාවය මත සිට ක්‍රියාකිරීම යහපත් බවයි. අගමැතිවරයාගේ වාචික ප්‍රකාශය අභියෝගට ලක්කරමින් ඉන්දියාව නොබියව මෙසේ ප්‍රකාශ කරන්නේ ලංකාව වැටී ඇති ආර්ථික අවපාතයත්, මෙම වරායේ ඇති දේශපාලන හා ආර්ථික වටිනාකමත් හොඳින්ම දන්නා නිසාය. මෙසේ රටේ ජනතාවගෙන් එල්ල වූ විරෝධයෙන් බේරීමට අගමැතිවරයාට ප්‍රකාශ සිදුකිරීමට හා තාවකාලිකව හකුලාගැනීමට සිදුවීම ජනතා ජයග්‍රහණයක් වුවත් ලංකාව හිරවී ඇති ආර්ථික හා දේශපාලන උගුලේ තරම අනුව කොළඹ වරාය හෝ රටේ අනෙකුත් සම්පත් අන්සතු කිරීමට සිදුවීම ආණ්ඩුවට නොවැළැක්විය හැකිය.

එක් පසෙකින් චීනය හා ඇමරිකාව ලෝක ආර්ථික බලවතා වීමට උත්සහා දරමින් සිටී. මෙම ආර්ථික උවමනාව පෙරදැරිව එකිනෙකා පරයමින් තම උවමනාවන් ඉටුකිරීමට ඇමරිකාව හා චීනය උත්සාහ දරයි. ඒ අනුව අද අපේ රටේ පාලකයින්, ඉන්දියන් සාගරයේ වටිනාම බිම්කඩ වන ලංකාව මෙම ලෝක බලවතුන්ගේ ආර්ථික යුද්ධයේ යුධ පිටියක් බවට පත්කර හමාරය. එසේ වුයේ අප රටේ පාලකයින් ක්‍රියාත්මක කළ වැරදි ආර්ථික හා දේශපාලන ප්‍රතිපත්ති නිසාය. එමෙන්ම පාලකයින්ගේ පරගැති, පසුගාමී මනෝභාවයන් ප්‍රයෝජනයට ගෙන ලෝක බලවතුන් අප භූමියේ කොටස් මිලදීගත්තේය. 99 අවුරුදු බදු පදනමින් තමන් සතු කරගත්තේය.

අනෙක් පසින් අපේ රට උග්‍ර ආර්ථික අර්බුදයක හිර කළේය. ඒ අනුව වර්තමාන පාලකයින් මේ වසරට ගැනීමට බලාපොරොත්තු වන ණය ප්‍රමාණය ට්‍රිලියන තුනකි. මෙලෙස 2021 වසර අවසන් වන විට රටේ ණය බර ට්‍රිලියන 16 ඉක්මවන්නේය. අයවැයට අනුව 2020 ගෙවුණු වසරේ ආදායම රු.බිලියන 1580 කි. නමුත් ඒ වසරේ ගෙවා ඇති ණය පොලී ප්‍රමාණය රු.බි.1854කි. මේ වසරද ගිය වසරට දෙවෙනි නොවේ!. 2021 සඳහා අපේක්ෂිත ආදායම රු. බිලියන 1919 කි. නමුත් 2021 සඳහා ගෙවීමට ඇති ණය හා පොලිය රු.බි.2110 කි. ගෙවීමට ඇති පොලී ප්‍රමාණයත් රටේ ආදායම ඉක්මවා ගොසිනි. මෙලෙස අපේ රට ණය උගුලක හිරවී ඇති බව පැහැදිලිය.

එමෙන්ම 2021 වසර සඳහා ආණ්ඩුව ඇස්තමේන්තු කර ඇති මුලු වියදම රු.බි.3594කි. නමුත් ආණ්ඩුව ප්‍රදාන සහිතව ලැබීමට අපේක්ෂිත ආදායම රු.බි.2029කි. මෙලෙස ගත් කළ රු.බි.1565 වන අයවැය පරතරය පියවා ගැනීමට නැවත ණය ගැනීමට සිදුවීම වළක්වා ගත නොහැකිය. මහ භාණ්ඩාගාරයද හිස්ය. එහි ඇත්තේ රු.බි.500කට වඩා වැඩි බැංකු අයිරාවකි. අප රට සතු විදෙස් සංචිත පහළ ගොස් ඇත්තේ ගිය වසරේ පොලී වාරික ගෙවීමට යොදාගත් නිසාය. මෙලෙස ලෝකය තුළ මූල්‍ය සුරක්ෂිතතාවය පිළිබඳව ලංකාව ඉතා පහළ මට්ටමකට ඇද වැටී ඇත.

එක් පසෙකින් ලෝක බල දේශපාලනයේ අතකොලුවක් වීමට සිදුවීමත්, අනෙක් පසින් ගොඩ ඒමට නොහැකි දැවැන්ත ආර්ථික අර්බුදක් සමඟ අඳුරේ අතපතගෑමටත් සිදුවී ඇත. මෙවැනි අරාජික වටපිටාවක් තුළ කොළඹ වරාය ඇමරිකානු න්‍යාය පත්‍රයේ කොටසක් බවට පත්වීම නොවැළැක්විය හැක. මේ අරාජිකත්වය හා අසරණභාවය අනුව නැගෙනහිර නොහැකිනම් බටහිර හෝ දීමට සිදුවන්නේය. මොවුන් නැගෙනහිරින් බටහිරට මාරුවීද සෑහීමකට පත්වන්නේ නැත. ඉන් නොවැතී රටේ අනෙකුත් වටිනා සම්පත් බෙදාගැනීමටද පොර අල්ලන්නේය.

ඒ අනුව ත්‍රිකුණාමල වරාය, පෝර්ට් සිටියේ ලංකාවට අයිති කොටස, කොළඹ නගරයේ වටිනා බිම් කොටස්, මත්තල ගුවන්තොටුපොළ, රටේ වටිනා වනාන්තර ඉඩම් ලෙස කැබලි කර ලබාගැනීම, රජය සතු නිෂ්පාදන හා සේවා ලබාගැනීම දක්වා මේ න්‍යාය පත්‍රයන් දික්වනවා නොඅනුමානය.

මෙලෙස රටේ ආර්ථික අර්බුදය හා පාලකයින්ගේ දුර්වල පරාදීන ආකල්ප ප්‍රයෝජනයට ගනිමින් සිදුවන අධිරාජ්‍යවාදී මැදිහත්වීම් හරහා මේ විනාශකරමින් හා අභිමිකරමින් සිටින්නේ රටේ අනාගත උරුමයයි. එය අනාගතය වෙනුවෙන් රැකගැනීම අද පරම්පරාවේ වගකීමක් වන්නේය. ඒ වෙනුවෙන් අත්වැල් බැඳගමු..! සංවිධානය වෙමු..!! සටන් කරමු..!!!

# සටන්කළ යුතුය සත්‍යය!




"1983! බැකෝ දෙකක් ඇවිත් ලොකු වලක් කැපුවා. හවස ඇවිත් මිනී 53ක් වැළලුවා. උන් දෙමළලු. ඊට පස්සෙ 88,89! වාහනවලින් ඇවිත් කුණු විසිකරන් යනවා වගේ තරුණ කොල්ලො කෙල්ලො මරල වීසිකරගෙන ගියා. උන් සිංහලලු.. 2009, 2010! හඳුනානොගත් මිනී වැළලුවා...මේ රටේ තව කොච්චර මිනිස්සු පොළොවට යටකරලා තියෙනවද?...."

ඒ වදන්, ඈතක සිට ඇහෙන වයලීනයක රිදුම් ස්වරය හා වේදනාවෙන් අනුනාද වූයේ හදේ ගැඹුරුම තැනදීය. බංඩාරලාට, මොහොමඩ්ලාට, චන්ද්‍රරේලාට මගහැරුණු ජීවිත කීයක්නම් මේ පොළොව මත නිස්කාරණයේ මිහිදන්වන්නට ඇත්ද?... පෙනෙන දෙය, පෙන්වන දෙය, ඇසෙන දෙය පමණක් පිළිගත් සමාජයකට 'යතාර්ථය' මඟනොහැරුණා විය හැකිද?...

මේ ඇසෙන්නේ අතීතය විසින් යටපත් කරන ලද, මඟහරවන ලද සත්‍යයේ දෝංකාරයයි. මේ ගොඩනැගෙන්නේ එදා මෙන්ම අදත් පටු අරමුණු වෙනුවෙන් ගොලුකළ, ගොලුකරන සත්‍යයේ නවමු සංවාදයයි. "සත්‍යා"- වළලන ලද ඉතිහාසයෙන් නැගිට අනාගතය අවදිකරන්නට දරන සත්‍යයේ වර්තමාන ප්‍රයත්නයයි. නාමල් ජයසිංහගේ තිරරචනයෙන් බිහිවූ "සත්‍යා" ටෙලිනිර්මාණයේ නිෂ්පාදනය චමත්කා පීරිස් විසින් වන අතර කලා අධ්‍යක්ෂණය චරිත් අබේසිංහ විසිනි.

"ගොඩක් පොඩි උන්ට කියවන පුරුද්ද නෑ බන්. අපි ඒක perform කරලා පෙන්නනවා."

"මොකටද බං ඔය? උඹලට පිස්සුද?.."

"මොකටද?..කලාව, සාහිත්‍යය ගැන අදහසක් නැති පරම්පරාවක් එක්ක ජීවත්වෙන්න බයයි මචං. උන් ප්‍රචණ්ඩයි. තර්කය නෑ. විකල්ප අදහස් නෑ. ඕනම වර්ගවාදයකට ලේසියෙන්ම නම්මගන්න පුළුවන්. එහෙම උන් එක්ක ජීවත්වෙන්න බයයි."

"පිස්සුද බං උඹලට?..එහෙම බයයි නම්, වීසා හදන් රටින් පලයන්.."

"උඹට එහෙම ඕන නම්, අපි ඒකටත් උදව්කරන්නම්. හැබැයි අපි යන්නෙ නෑ. ඒ හන්දා අපි මේ රට හදාගන්න ට්‍රයි කරනවා.."

විදෙස්ගත වී මුදල් උපයා ජීවිතය ගොඩදාගැනීම සිහිනය කරගත්, අප රටේ අවස්ථා නොලත් බහුතර තරුණයා විජිත්ය. ටැක්සි රියැදුරෙකු ලෙස උපයන සොච්චමෙන් ඒ සිහිනය සැබෑකරගැනීම ඔහුගේ අරමුණයි. නමුත් 'කාටවත් වරදක් නොකර, වදයක් නොවී' ජීවත්වීමට තනන විජිත්ලා වැනි තරුණයින්ට මේ සමාජයේ ගොදුරක් නොවී සිටීමට හැකිවේද?. තම පෞද්ගලික ජීවිතයට කොටු වූ තරුණයින්ට තවදුරටත් සමාජයෙන් වියුක්තව ජීවත්විය නොහැකි බව "සත්‍යා"පවසයි.

"..මේ සමාජයට ඕන නීතිය හා සාධාරණය නෙවෙයි. උන්ට ඕන ප්‍රචණ්ඩත්වය. දැන් ඒක වැස්සක් වගේ කඩාපාත්වෙන්න පටන් අරන්. ඒ වැස්ස වැටෙනකොට වැටෙන්නෙ ජාතිය,ආගම, මැරයො, අහිංසකයෝ බේරලා නෙවෙයි. වෙනසක් නැතුව අපි හැමෝටම තෙමෙන්න වෙනවා.."

ආර්ථික අපහසුතාවන් ඉදිරියේ ජීවිතය ගොඩදාගැනීමට වූ සියලු ප්‍රයත්නයන් අසාර්ථක වූ තැන සමාජ අසාධාරණයන් විසින් තරුණයින්ව මෙහෙයවන්නේ කුමන දෙසකටද?...මාකඳුරේ මදූෂ්ලා මෙන්ම ජූඩ්ලා, ලසන්තලාද අපට හමුවන්නේ එමගේ එක් අන්තයකදීය. තම පටු අරමුණු වෙනුවෙන් ඔවුන්ව සූක්ෂමව මෙහෙයවන්නේද, විටෙක ඔවුන්ට 'පාතාල' හෝ 'අපරාධකාර' ලේබල් අලවා තම කිළුටු වසාගන්නේද ඔවුන්ව බිහිකරන මේ සමාජයේ නරුම පාලකයින්ය.

ජීවත්ව සිටියදීම ඔබව වැළලූයේ නම් සටන්කිරීම මිසෙක ඔබ කරනුයේ කුමක්ද?." සත්‍යා"- වර්තමාන අප රටේ තාරුණ්‍යයේ යතාර්ථයයි.. අපේක්ෂාභංගත්වය උඩුදිවූ, අතීතය අඳුරුකොට, වර්තමානයද අනාගතයද අවිනිශ්චිත කළ විජිත්ලා, ජූඩ්ලා, ලසන්තලා ප්‍රමුඛ අප රටේ වර්තමාන තාරුණ්‍යයේ කතාවයි. ඉතින් ඔවුන්ට සියලු අසාධාරණයන්ට එරෙහිව සටන්කිරීම විනා අන් කවර විකල්පයක් ද?.."සත්‍යා"- විකල්පයේ තෝරාගැනීමයි.

"තනියෙන් දියුණුවෙලා වැඩක් නෑ බන්. එහෙම දියුණුවුණත් ඒක අත්විඳින්න බෑ. බයෙන් ජීවත්වෙන්න වෙන්නෙ."

"ඔච්චර මහන්සි වෙන්න එපා සංජය. මේ රට වෙනස්වෙන්නෑ. මේකෙ උන්ට එහෙම උවමනාවක් නෑ."

"උඹේ විදියට සමාජෙ ගැන හිතන්න එපා බන්. ගොබ්බයි එතකොට."

තම ජීවිතය පමණක් ගොඩදාගෙන, ගොඩයා හැකිබව විශ්වාස කරන පටු රාමුවෙන් ඔබ්බට, ජීවිතය හා සමාජය බද්ධව කියවාගත් තරුණයා සංජයය. ඔහු පවසන්නේ විජිත්ලාට මෙන්ම ජූඩ්ලාටද අහිමි කර ඇති ජීවිත වෙනුවෙන් සටන් කළ යුතු බවය.. ඒ සඳහා කලාව, දැනුම, බුද්ධිය හා උගත්කම අවිකරගත යුතු බවය. මිනිසා නම් වූ දේශපාලනික සත්වයා දේශපාලනයේදී සබුද්ධික විය යුතු බවය.."සත්‍යා" පවසන්නේ සැමට යහපත්ව ජීවත්වීමට නම් සැවොම එක්ව යහපත් සමාජයක් ගොඩනැගිය යුතු බවය. ඒ සඳහා වත්මන් තාරුණ්‍යය උරදිය යුතු බවය..

සත්‍යා එකී කාර්යයේදී එක්කරගන්නේ රටේ ප්‍රගතිශීලී, වමේ වැඩිහිටි පරපුරය. ඔවුන්ගේ දැනුම හා අත්දැකීම්ය, දිරිගැන්වම්ය. බංඩාර මාමා සහ ඔහුගේ හිතමිතුරන් අපට හමුවන්නේ එලෙසය.

"පොත් කියෙව්වත්, කුණු ඇද්දත් උඹට උදව්කරන්නේ එකම හැඟීමෙන්. ඒ මොකක් හරි හොඳක් කරන එක. අපි අමාරුවෙන් පවත්වගෙන යන මනුස්සකම පවත්වගෙන යන එක...මේ රට දැන් යන විදිය ගැන කාටවත් සතුටක් නෑ මචං. අපි හැමෝම අනාථයි. හැබැයි අපි උත්සාහය අතෑරලා නෑ..."

අතිශය දුෂ්කර අවස්ථාවකදී පවා මිනිස්කම් අමතක නොකළ යුතුය. අනතුර දැක දැකත් බංඩාර මාමා විජිත්ව ජීවත්කරන්නේ ඒ උතුම් මිනිස්කම නිසාය. සංජය හා ඔහුගේ මිතුරන් විජිත්ව හැර නොයන්නේ ඒ නිසාය. ලබාගත හැකිබව දැනත්, තම ආදරියගේ යහපත වෙනුවෙන් විජිත්, ශාක්‍යාට නොපෙනෙන මානයේ සිටින්නේ ඒ නිසාය. නොලැබෙන බව දැන දැනම, ශාක්‍යා තම ප්‍රේමය සොයායන්නේත්, ඔහුට තව තවත් පෙමින් බැඳෙන්නේත් එනිසාය. පෙම්වතටගේ නෑ හිතමිතුරන් පවා සොයා ගොස් ඈ ඇගේ ආදරය බෙදාගන්නේ එනිසාය. සැලුන් එකේ හිමිකරු වන් සමාජයේ පීඩාවට පත්වන ජන කොටස් අප සැමගේ සමානයන් බව "සත්‍යා" කියන්නේ එනිසාය. මානව දයාව නම් වූ ඒ අසීමිත හැඟීම මුසුකොට මෙම නිර්මාණය මෑදුකළ අයුරු සුන්දරය...

බොරු හීන මවමින් තාරුණ්‍යය අතරමං කළ, තාරුණ්‍යයේ සැබෑ ජවය එකිනෙකා මරාගැනීමට මෙහෙයවූ, දැනුමෙන්, බුද්ධියෙන්, ශක්තියෙන් හෙබි තරුණ බලකායක් බිහිකිරීම වෙනුවට අවිගත්, මතින් මත් වූ වරදකරුවන් නිර්මාණය කළ, නිර්මාණය කරමින් සිටින ඉතිහාසයක්, වර්තමානයක් ඇති අපගේ එකම විකල්පය, නිහඬව සිටීම හෝ පලායාම වෙනුවට අහිමි වූ සියලු අයිතීන්, වරප්‍රසාද වෙනුවෙන් 'බුද්ධියෙන් සටන්කිරීම තෝරාගැනීමම' බව මේ කතාවේ සාරයයි.. එය චරිත කීපයක් අතරින් මාත්‍රා ලෙස ප්‍රේක්ෂකයින්ගේ බුද්ධිය වෙත මෙහෙයවනයුරු අපූරුය. "සත්‍යා" මේ යුගයේ අතිවිශිෂ්ඨ සමාජ ආමන්ත්‍රණයක් බව කිව යුතුමය.

"සත්‍යා"-යහපත් සමාජයක් බිහිකරගැනීමට නම් සත්‍ය සටන් කළ යුතුමය....!!

## සරදියෙල්ගේ කොලම

දැන් දැන් මේ අමුතු ඇටේ විකට චිත්‍රපටි හැදෙන්නේ නෑ. විකට ජවනිකා කරපු නලුවන්ට වැලේ වැල් නැතුව ඉන්නේ. රටේ ප්‍රධාන පුරවැසියා විකටයෙක් උනාම ඔහොම තමයි ඉතින්. පහුගිය දොහේ රටේ නම් දරාපු විකට නලුවෝ රඟපාන්න තැනක් නැතුව දේශපාලුවන්ගේ වේදිකා උඩ රැඟුවා. මාර වැඩේ අමුතු ඇටේට උනේ!. උන්ගේ රැඟිලිවලට රැවටිච්ච මෝඩ වැසියන්ට දැන් යන එනමන් නැතිවෙලා තියෙන්නේ.

සපට බිමට. බඩු මිල අහසට. කහ නිකන් රත්තරන් වගේ. පාටින් විතරක් නෙමෙයි, මිලෙනුත්. අමාරුවෙන් කාසි එකතු කරන් ගිහින් කන් හැන්දෙන් මැනලා තමයි බහුතරේ කුඩු ගන්නේ. මං කිව්වේ කහ. ඒ උනාට අර පත්වෙච්ච විකට රජා අත්තඩංගුවට ගන්න කහ ගිණි තියනවා. මාර ජෝක් තමයි මෑන් සපයන්නේ. මෑන්ගේ පිට කහපු බහුතරේට කහ ගන්න විදියක් නැතුව දැන් ලතැවෙනවා.

සව්බාගේ දැක්මට අනුව අරුන් විකුණපුවත් ගන්නවා කියලා ආපු එකා, දැන් විකුණනවා. අහ් නෑනේ, ආයෝජනය කරනවාලු. හම්බන්තොට චීනෙට. ජැටිය ඉන්දියාවට. ජැටියේ වැඩකරන මිනිස්සු හරි අපූරුවට කියලා දුන්නා සෙල්ලං දාන්න එන්නෙපා කියලා. නන්දසේන හොට බිම ඇනගත්ත. මොනවා උනත් අපේ හුදී ජනයාත් හොට බිම ඇනගෙනම තමයි පාඩම් ඉගෙනගන්නේ. හැමදාම කොරන්නේ ඉඟුරු දීලා මිරිස් ගන්න ජාතියේ වැඩ. දේවල් තේරුන්ගන්නේම පමාවෙලා. සරදියෙල්ට ඇහෙනවා ඈතින් කොල්ලෙක් මෙහෙම සින්දුවක් කියනවා.

ලක්මව දැන් ඇත ඝන අඳුරේ...
නන්දේ සමඟ ගම පිළිසඳරේ...
අන්න බලන් හොරකම් සබඳේ...
කෙලවී ඇත මුට දීලා අනේ...

ඝන උඩු රැවුලට ආලය හිතිලා...
ඔබහට අසිපත දීලා දැම්මා...
රටේම ගහකොළ කපලා දැම්මා...
දැන් ෂැපද අසන්න කෙනෙක් නැතේ...

අවසන් වසරෙදි පාස්කු විපතේ...
ඔබ අතවැනුවා වීරයා වගේ...
ඒ පිටුපස මහ මොළකරු වී...
නන්දේ කුමරා ඔබ නොවෙද අනේ?...

නූතන පරපුරේ
සරදියල්



# වැනසෙන මුතු-රාජ-වෙල

අතීතයේදී මුතු මෙන් වටිනා සහල් නිෂ්පාදනය කළ, රජුට අයත් වෙල්යාය 'මුතුරාජවෙල' ලෙස හඳුන්වනු ලබයි. අද මෙම භූමිය ලවණ සහිත වෙරලාශ්‍රිත තෙත් භූමියකි. ඉංග්‍රීසීන් විසින් භාණ්ඩ ප්‍රවාහනය සඳහා හැමිල්ටන් ඇළ නිර්මාණය කිරීම නිසා ලවණ සහිත ජලය එක්වීමත්, වසර සියගණනක් ලවණ සහිත ජලය ඉහල-පහල යමින්, කොළඹ, ගම්පහ ප්‍රදේශවලට වර්ෂාවෙන් පතිත වන ජලය ගලාගෙන විත් තැම්පත් වන රොන්මඩ නිසාත් විශේෂ ජෛව විවිධත්වයක් සහිත පරිසර පද්ධතියක් ලෙස නිර්මාණය වී ඇති මුතුරාජවෙල අභයභූමියක් ලෙසද නම් කොට ඇත.

එමෙන්ම මුතුරාජවෙල, ලංකාවේ ප්‍රමුඛම තෙත් බිම් පද්ධති 12න් එකකි. ආසියානු තෙත් බිම් නාමාවලියේ ජාත්‍යන්තරව වැදගත් වන ලංකාවේ තෙත් බිම් 41 අතුරෙන් එකකි. මීගමුව කලපුව හා සම්බන්ධිතව හෙක්ටෙයාර 3164ක භූමියක් පුරා පවතින මුතුරාජවෙල තෙත් බිම් පද්ධතිය, නොග ැඹුරු මුහුදු තීරයේ ජීවත් වන සාගර මත්ස්‍ය විශේෂ, ඉස්සන් හා කකුළුවන් විශේෂවල ප්‍රධාන බෝවීමේ ප්‍රදේශයකි. මේ නිසා මීගමුව කලපුවේ මත්ස්‍ය විශේෂවල පැවැත්ම මෙන්ම සුළු පන්න ධීවරයින්ගේ පැවැත්මද රඳා ඇත්තේ මෙම තෙත් බිම් පද්ධතිය මතය.

දැනට සිදුකර ඇති අධ්‍යයනවලට අනුව ජෛව විද්‍යාත්මකව ඉතා වටිනා තෙත් බිම් පරිසරයක් වන මෙහි විවිධ පරිසර පද්ධති රාශියක් දැක ගත හැකිය. කඩොලාන බිම්, ලවණ වගුරු බිම්, ලවණ ජලය හා මිරිදිය ජලය සහිත ඇළ මාර්ග, තෘණ භූමි, පඳුරු වනාන්තර, ගංඟාශ්‍රිත වනාන්තර ඒ අතර වේ. මෙම විවිධ වූ පරිසර පද්ධතිවල ශාක කුල 66කට අයත් ශාක විශේෂ 194ක් වාර්තා වේ. එමෙන්ම අති විශාල සත්ව ප්‍රජාවකට වාසස්ථාන සපයන මේ තෙත් බිමේ සමනලුන්, බත්කූරන්, මත්ස්‍යයින්, උභයජීවීන්, පක්ෂීන් හා ක්ෂීරපායීන් ඇතුළු සත්ව කාණ්ඩ 7ට අයත් විශේෂ 449ක් පමණ වාර්තා වී ඇත. ඉන් විශේෂ 27ක් මෙරටට ආවේණික සත්ව විශේෂ වේ. පක්ෂීන්ගේ සුවිශේෂී ගොදුරු බිමක් හා ලැගුම් පොළක්ද වන මුතුරාජවෙල තෙත් බිමේ නේවාසික පක්ෂි විශේෂ 86ක් පමණ ජීවත් වන අතර සංක්‍රමණික පක්ෂි විශේෂ 43ක් පමණ වාර්තා වී තිබේ. විශේෂයෙන් බටහිර සංක්‍රමණික මාර්ග යෙන් ලංකාවට පැමිණෙන පක්ෂි විශේෂ බහුලව මෙම තෙත් බිමෙන් වාර්තා වේ.

1994 වසරේදී මධ්‍යම පරිසර අධිකාරියේ, තෙත් බිම් සංරක්ෂණ ව්‍යාපෘතිය මඟින් මුතුරාජවෙල කොටස් තුනකට වෙන් කරන ලදී. එනම් කොළඹ ආශ්‍රිත දැඩි නාගරික සීමාවේ පිහිටි තෙත් බිම් ප්‍රදේශය උප කාර්මික කලාපය ලෙසත්, මීගමුව කලපුව ආශ්‍රිතව පිහිටි කොටස මුතුරාජවෙල අභය භූමිය ලෙසත්, ඒ අතර කොටස ස්වාරක්ෂක කලාපය හෙවත් ප්‍රේරක කලාපය ලෙසත්ය. මෙලෙස කොළඹ, ගම්පහ හා මීගමුව වැනි ඉතා ජනාකීර්ණ කාර්මික නගරවලට යාබදව පිහිටා ඇති බැවින් මෙම පරිසර පද්ධතිය මඟින් කාබන්ඩයොක්සයිඩ් පාලනයට, අධික උණුසුම පාලනයට මෙන්ම ඉතා ඉක්මනින් ජලය උරාග නිමින් ජලගැලීම් පාලනයටද මහගු දායකත්වයක් සපයයි.

මෙවන් අධි පාරසරික වටිනාකමක් සහිත මුතුරාජවෙල පරිසර පද්ධතිය ඉතිහාසයේ සිටම පාලකයින්ට පෙනුනේ කිසි ප්‍රයෝජනයක් නැති මුඩුබිමක් ලෙසය. මේ නිසා මුතුරාජවෙල පරිසර පද්ධතිය නිවාස ව්‍යාපෘතිවල, හෝටල්වල, කර්මාන්තශාලාවල මෙන්ම අධිවේගී මාර්ගවලද ගොදුරු බිමක් බවට පත්විය. නමුත් පරිසර හිතකාමීන්ගේ මැදිහත්වීම හා දැඩි ජනතා විරෝධය නිසා අදටද මුතුරාජවෙල පරිසර පද්ධතිය රැකගැනීමට හැකි වී ඇත.



නමුත් නැවත වටයකින් මුතුරාජවෙල විනාශයට මාන බලන මැල්වත්ත ප්‍රොපටි ඩිවෙලොප්මන්ට් පුද්ගලික සමාගම මෙම තෙත් බිම් පද්ධතියේ අක්කර 700ක භූමියක ගොල්ෆ් ක්‍රීඩා පිටියක් හා හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමට මේ වන විටත් ඉඩම් වෙන් කර තිබේ. මෙම ආණ්ඩු හිතවාදී සමාගම මීට පෙරද මුතුරාජවෙල පරිසර පද්ධතියට අයත් ඉඩම් මිලදීග නිමින් හා ගොඩකරමින් විනාශයට මුලපිරූ නමුත් පරිසර සංවිධාන හා ජනතාවගේ විරෝධය නිසා එම ව්‍යාපෘති නතරකර දැමුවේය. නමුත් වර්තමාන ආණ්ඩුව බලයට ඒමත් සමඟ මෙම නව ව්‍යාපෘතියට අත ගසා ඇත. මේ සඳහා පරිසර ඇගයීමක් කිරීමටද අවසර ලබාගෙන ඇත.

මෙලෙස කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කයේ පෙනහලු බඳු මුතුරාජවෙල පරිසර පද්ධතිය විනාශවීම මඟින් උෂ්ණත්වය අධික ලෙස ඉහල යෑම, ලවණ ජලය ගොඩබිම් ජලය සමඟ මුසුවීම, ගංවතුර හා ජලගැලීම් වැඩිවීම, ශාක හා සත්ව කොටස් වඳවීමේ තර්ජනයට මුහුණදීම හා එමඟින් ධීවර ජනතාවගේ ආදායම් මාර්ග ඇහිරීම වැනි හානි සිදුවනු නිසැකය. එමඟින් සාමාන්‍ය ජනජීවිතයට බාධා පැමිණෙනවා මෙන්ම අපේ රටේ පරිසර පද්ධතියට වන හානියද ගිණිය නොහැකි තරම් වේ.

වර්තමාන ආණ්ඩුව බලයට ඒමත් සමඟ අන් කවරදාටත් වඩා පරිසර විනාශය වේගවත් විය. නමුත් ඔවුන්ගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනයේ නම් ඇත්තේ පරිසර පද්ධති රැකගනිමින්, තිබෙන ප්‍රමාණයද වර්ධනය කරන බවය. මෙලෙස පාලකයින් විසින් ජනවරමට පිටුපාමින් විනාශ කරනු ලබන, අනාගතයට අවැසි වටිනා පරිසර පද්ධති රැකගැනීම අප කාගේත් යුතුකමක් වන්නේය.

# The Gadget

## Eye Que

Eye Que යනු ඔබේ නිවසේ දෘෂ්ටි පරීක්ෂකයායි. ඔබ කැමති වාර ගණනක් ඔබේ ඇස් පරීක්ෂා කර කාලයත් සමඟ ඔබේ දැක්ම ඉතා හොඳින් නිරීක්ෂණය කරන්න දැන් ඔබට නිවසේ සිටම පුලුවන්. ඔබට භාවිතාවේදී යම් ගැටලු තත්වයක් ඇති වුවහොත් ඉහළම විශ්වාසනීය පාරිභෝගික සේවයක්ද ඔවුන් ලබා දෙයි.




## Nuro

කොරෝනා වසංගතයත් සමඟම ස්වයංක්‍රීය ට්‍රක් රථ සහ බෙදාහැරීමේ වාහන සංවර්ධනය කරන සමාගම්වලටද ආයෝජකයින්ගේ උනන්දුව ලැබෙමින් පවතී. නමුත් මෙහි සාර්ථක ප්‍රතිඵල ලබා ඇත්තේ කැලිෆෝනියාවේ පිහිටි මවුන්ටන් වීව්හි සමාගමයි. එයට හේතුව වන්නේ ස්වයංක්‍රීය බෙදාහැරීමේ වාහන විසින් පීසා සිට බෙහෙත් වට්ටෝරු දක්වාම භාණ්ඩ, 2018 සිට අඛණ්ඩව මහජනතාව වෙත ලබා දී තිබීමයි.






AntiVirBag අතේ ගෙන යා හැකි වායුව පිරිසිදු කරන උපාංගයකි. මෙය බැටරිවලින් ක්‍රියාත්මක වන අතර වර්ග මීටර් 20ක් පමණ විශාල කාමරයකට පිරිසිදු වාතය සපයයි. නිවසේ, රැකියාවෙහි, මෝටර් රථයක, විදුලි සෝපානයක හෝ අවන්හලක වේවා, මෙම ගැජටය ඔබට පිරිසිදු හුස්ම ලබාගැනීමට උපකාරී වේ. අතේ ගෙන යා හැකි මෙම AntiVirBag උපකරණය නිසා රෝග ආසාදනය වීමේ හැකියාවද අඩුකර ගත හැකිය.




## Digital

Digital Bangle යනු ආභරණ කලාවේ මීළඟ පියවරයි. එය සැමවිටම ඔබේ මනෝභාවයට හා ඔබේ ඇඳුමට ගැළපේ. ඔබේ අවශ්‍යතාවයට සරිලන පරිදි අනුවර්තනය වීමේ හැකියාවද වළල්ලට ඇත. ඔබගේ දුරකතනය සමඟ සම්බන්ධව ඔබේ එදිනෙදා කාර්යයන් පහසු කරලීමටද උපකාරී වේ.

## G2T

G2T උපකරණය මඟින් උණුසුම හා සිසිලන ක්‍රියාකාරිත්වය මිනිසාට ස්වභාවික පිළියමක් ලෙස සමීප කරයි. උණුසුම්/ සීතල කාලගුණයෙන් පෙළෙන අයට, උණ හෝ ඔසප්වීමේ වේදනාව ඇති අයට, වේදනාව තාවකාලිකව සමනය කිරීමට G2T උපකාරී වේ.

මෙමඟින් පරිශීලකයින්ට අවශ්‍ය තාක් කල් අඛණ්ඩව සිසිලනය සහ උණුසුම ලබාදිය හැකි අතර එදිනෙදා ජීවිතයෙන් මිනිසුන් වඩාත් උද්‍යෝගිමත් කරයි.




facebook
















# දැනුම



# ඓතිහාසික කාලච්ඡේදය

## පෘථිවියේ උපත

පෘථිවියේ ජීවීන්ගේ බිහිවීම අධ්‍යනයේ පහසුව සඳහා යුග, යුගාන්තර, කාල පරිච්ඡේද, අවදි කාලාන්තරය ලෙස බෙදා වෙන්කොට අධ්‍යනය කරන බව අප පසුගිය කලාපයෙන් සාකච්ඡා කළා. මෙම කලාපයේදී පෘථිවියේ උපත සිදුවන ප්‍රාග් කේම්බ්‍රියානු කාලාන්තරය පිළිබඳ සාකච්ඡා කරමු.

### ප්‍රාග් කේම්බ්‍රියානු කාලාන්තරය
**(වසර මිලියන 4500කට පෙර සිට වසර මිලියන 544කට පෙර දක්වා)**

මීට වසර මිලියන 4500කට පමණ පෙරදී පෘථිවියේ සම්භවය සිදුවිය. ආරම්භයේ එය ගුගුරා හැලෙන ගිනියම් වායු හා ලෝදිය ගුලියක් පමණි. මෙම යෝධ ලෝදිය ගුලිය කෙමෙන් සිසිල් වී පෘථිවියේ මූලික හැඩය ගැනීමටත්, ඒ මත ප්‍රාථමික ජීවීන් බිහිවීමටත් වසර මිලියන 4000ක්ම ගත විය.

අප ජනිත කළ මෙම ග්‍රහලොව බිහිවූයේ කෙසේද යන්න නියත ලෙස නිගමනය කිරීමට තරම් අපගේ දැනුම තවමත් ප්‍රමාණවත් නැත. එහෙයින් ඒ පිළිබඳව විද්‍යාඥයින් විසින් කලින් කල ඉදිරිපත් කර ඇති විවිධ මතිමතාන්තර තවමත් උපකල්පනයන්ට පමණක් සීමා වන බව අප විසින් අමතක කළ යුතු නොවේ.

එබඳු එක් මතයකට අනුව අදින් වසර මිලියන 4500කට පෙර විශ්වයේ ඉතා විරල, අසිරිමත් දෙයක් සිදුවිය. අපගේ සූර්යයා ක්ෂීරපථයේ තනි තරුවක්ව බැබළෙමින් තිබුණි. අයාලේ ගිය තරුවක් අහම්බෙන් අපගේ සූර්යයා දෙසට වේගයෙන් ඇදී එන්නට විය. වාසනාවකට මෙන් එය සූර්යයා හා නොගැටී ඒ අසලින් ඉවතට ඇදී ගියේය. එහෙත් එය ඇදී ගියේ තනිවම නොවේ!. අපගේ සූර්යයා මත ගිණිගෙන දැවෙමින් තිබූ මහා ලෝදිය සම්භාරයක් ඒ තරුවේ ගුරුත්වාකර්ශණයට හසුවී සූර්යයාගෙන් ගැලවී ඒ පසුපස හඹා ගියේය. ආගන්තුක තරුව වෙතට ඇදී ගිය ඒ යෝධ ද්‍රව සම්භාරය එම තරුව මත පතිත වීමට පෙර ආගන්තුක තරුව වේගයෙන් ඈතට ඇදී ගියේය.

අජටාකාශයේ අතරමං වූ මෙම ද්‍රව ස්කන්ධ සූර්යයාගේ ගුරුත්වාකර්ෂණයෙන් ගැලවී ගත නොහී ඒ වටා කක්ෂගත විය. පසු කලක පෘථිවියද ඇතුළු සූර්යය ග්‍රහ මණ්ඩලය බවට පත් වූයේ ඝනීභවනය වූ එම ද්‍රව ස්කන්ධයන්ය. ඉහත දක්වන ලද්දේ පෘථිවියද ඇතුළු සූර්ය ග්‍රහ මණ්ඩලයේ උපත පිළිබඳ විද්‍යාඥයින් විසින් පළකොට ඇති විවිධ මත අතුරින් එක් මතයකි.

ලෝකයේ සම්භවය පිළිබඳව මත අතුරින් තවත් වැදගත් මතයක් වී ඇත්තේ 1900දී ඇමෙරිකානු ජාතික අජටාකාශ විද්‍යාඥයෙකු වූ කීලර් ඉදිරිපත් කළ මතයයි. ඔහුට අනුව සූර්ය ග්‍රහ මණ්ඩලය බිහිවූයේ අධිවේගයෙන් භ්‍රමණය වෙමින් පැවති මන්දාකිණියක් තුළ වූ විවිධ වායු හා අංශු ග්‍රහලෝක, ග්‍රාහක හා උල්කා ආදිය බවට පත්වීමෙනි. මෙම න්‍යායයේ වලංගුභාවය ඔප්පු වන සාධක රැසක් නූතන අජටාකාශ ගවේෂණවලින් හෙලි වී ඇත. හබල් වැනි නවතම දුරේක්ෂ මගින් ඈත පිහිටි මන්දාකිණි තුළ සූර්යයන් හා ග්‍රහයන් බිහිවන ආකාරය පිළිබඳ නිරීක්ෂණ රැසක් සිදුකොට ඇත. මෑතක දී අපේ විද්‍යාඥයින්ගේ නිරීක්ෂණයට හසු වූ එබඳු මන්දාකිනියක් 'එ16' නමින් නම් කර තිබේ.

අපගේ සූර්යයාද ක්ෂීර පථය (Milky Way) මන්දාකිණියට අයත් කුඩා තරුවකි. ක්ෂීරපථය වනාහී විශ්වයේ විසිර ඇති කෝටි සංඛ්‍යාත මන්දාකිණි අතුරින් මධ්‍ය ප්‍රමාණයේ මන්දාකිණියක් පමණකි. සර්පිලාකාර හැඩයෙන් යුතු එය අපගේ සූර්යයා බඳු හුදු මහත් තාරකා මිලියන 15,000කින් පමණ (150,000,000,000) සමන්විත එකක් යැයි සොයාගෙන ඇත. මෙහි මධ්‍යයේ සිට ඈත කෙළවර දක්වා දුර කිලෝමීටර් 4,704,000,000,000,000,000, 000කි. මෙබඳු සංඛ්‍යාවක් එකවර ග්‍රහණය කරගැනීම දුෂ්කර හෙයින් විද්‍යාඥයෝ මෙබඳු විශාල දුර ප්‍රමාණයක් දැක්වීමට වඩා සරල මිනුම් ක්‍රමයක් යොදා ගත්හ. එය නම් ආලෝක වර්ෂ මිණුමයි. ආලෝක වර්ෂයක් යනු ආලෝකය වසරක් පුරා ගමන් කරන දුර ප්‍රමාණයයි. එනම් කිලෝමීටර් 9,408,000,000,000කි. මේ අනුව ක්ෂීර පථයේ විශ්කම්භය ආලෝක වර්ෂ 100,000 කි. අපගේ සූර්යයා ක්ෂීරපථය මධ්‍යයේ සිට ආලෝක වර්ෂ 30,000ක් පමණ ඈතින් පිහිටි කක්ෂයක පිහිටා ක්ෂීරපථයේ මධ්‍යය වටා භ්‍රමණය වෙමින් සිටී. මෙම භ්‍රමණයේදී එක් වටයක් ගමන් කිරීමට ඊට ව්‍යවහාර වර්ෂවලින් වසර මිලියන දෙසිය පනහක් ගතවේ. විශ්වයේ විශාලත්වය පිළිබඳව අදහසක් ඇති කර ගැනීමට මෙම සංඛ්‍යා ප්‍රමාණවත් වනු ඇත.

දැනට දන්නා පරිදි මීට වසර බිලියන 4 - 5 කට පෙර උපත ලැබූ අපගේ ලෝකය, සූර්යයාගේ ගුරුත්වයෙන් මිදීය නොහැකිව ඊට කිලෝමීටර මිලියන 150ක් පමණ දුරින් වූ කක්ෂයකට පිළිපන්නේය. එදා සිට අද දක්වා පැයට කිලෝමීටර් 1600ක වේගයෙන් තම අක්ෂය වටා කැවෙමින් (භ්‍රමණය වෙමින්) පැය කිලෝමීටර් 106,000ක වේගයෙන් එක් වටයක් කිලෝමීටර් 938900000ක් වූ දුර වූ සිය කක්ෂයේ අනන්ත වූ චාරිකාවක නියැලී සිටී. අනපේක්ෂිත අනතුරක් සිදු නොවුවහොත් අපට සෙවණ දෙමින් අනාගතයේද වසර බිලියන ගණනාවක් මෙසේ ගමනෙහි යෙදෙනු ඇති බවට ශේෂ මාත්‍ර සැකයක් නැත.

# රැඩිකල් වෙමු!

පෙබරවාරි කියන්නේ නිදහස සහ ආදරය ගැන වැඩිපුර කතාවෙන මාසයක්. මොකද ජාතික නිදහස් දිනය සහ ආදරවන්තයින්ගේ දිනයත් යෙදී තිබෙන්නේ පෙබරවාරි මාසයේ නිසා. තරුණයන් විදියට වර්තමානයේ අප නිදහසක් අත්විඳිනවාද? සුදු අධිරාජ්‍යයෙන් මිදී වසර 74කට පසුවත් අප සිටින්නේ කොතනද? තරුණයෙක් විදියට අපට කැමති තැනක ඇවිදින්න, ආස ඇඳුමක් අඳින්න, කැමති කෑමක් කන්න ආර්ථිකයක් තියෙනවද? ඔබ කැමති පුද්ගලයා විවාහ කරගන්න, ඒ කෙනා එක්ක නිදහසේ අතින් අල්ලන් ඇවිදින්න, තනි වුණු වෙලාවක සිපගන්න, අඩු ගානේ විවාහ වෙන්න අකමැති නම් විවාහ නොවී සිටීමටවත් නිදහසක් තිබෙනවාද?



අපි චීනේ නිෂ්පාදනය කරපු කොඩියක් පෙබරවාරි 4 අභිමානයෙන් ඔසවලා, චීනේ හදපු රෝස මලක් පෙබරවාරි 14 ආදරවන්තයට දීලා සමරන්නේ ඇත්තටම නිදහසද? ඇත්තටම ආදරයද?

වැලන්ටයින් එකට හොඳම තෑග්ග පෙම්වතුන්ට දෙන්න අද තාරුණ්‍යය පොළඹවලා තියෙනවා. සැබෑ ආදරය කියන්නේ ආර්ථික තත්වයෙන් මනින දෙයක් නෙවෙයි කියලා තරුණයා තේරුම් ගත්තොත් මේ ආර්ථිකය ඇතුළේ ඔහුව හිරකරන්න බැරි වෙනවා. තරුණයා නිදහසේ හිතන්න පටන් ගත්තොත් එදා ඉඳන් පාලකයාට මේ ක්‍රමය පවත්වාගෙන යන්න බැරි වෙනවා.

අපේ ජීවිතවල නිදහස, සතුට අවුරුදු 74ක් මේ රටේ හදපු ආර්ථිකය විසින් හිරකරලා. තරුණ තරුණියන් විදියට අපි මේ යදම්වලින් මිදිය යුතුයි. පෙබරවාරි 4 අපි සමරන ව්‍යාජ නිදහසත්, 14 සමරන වාණිජ ආදරයත් වෙනුවට පෙබරවාරියේ ඇත්තම නිදහසත් සැබෑ ආදරයත් දිනාගැනීම උදෙසා සටන් කරන්න ආරම්භ කරමු!.

# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## මාස්කුව

මේකප් දැමූ මුව කමල
නුඹේ දෑස් දුටුවද
මාස්කුව
එය රසවිඳීමට
විටෙක,
රැවුම් ගෙරවිලි නිහඬ කරවන
ලස්සන මුවගේ සිනාව
රඳවන මාස්කුව..
තවත් විටක සීතල උදයේ
මුවගේ අග රැඳුණු කුසුම
වසන් කිරීමට
හරි දක්ෂයි නුඹ හරි අපූරුවට....

] **සචින්තා මදුශානි - අම්පාර**[



## ඇත්තටම තව හේතු තිබුණද?

බිම ඉඳන් තරු ගණින හිත්වල
අහස පොළවට දුරයි කිවුවද?
නිකමටම හරි එයා ඇවිදින්
පෙර වගේ දුක අහන් උන්නද?
නීල දියකඳ නොදැන හරි නුඹ
සැණින් බොර දිය වුණා එහෙමද?
මැණික නුඹ, හැරයන්න මේ හැර
ඇත්තටම තව හේතු තිබුණද?...

]**දිල්රුක්ෂි අබේසිංහ - අම්පාර**[

## ආදර අන්දර

වියළී ගිය ශුෂ්ක කලාපෙක
ඉඩෝරයට හසුවුණ ගහක්..
කේෂික මුලුත් අරටු මෙන් හයිය
වස්සානයක වැස්සක් වැටුණත්
දිය උරා නොගෙන විළිකුන්ව
ඉන්න හැටි නුඹත්....
සෙනෙහේ දියවර නැවත
ගලා ගිය පසුව මුහුදට
ආයෙමත් ඉඩෝරයටම
පෙම් බඳින්නද හිත?...

] **යශෝධා සමරධීර - හම්බන්තොට** [



## මළගෙයක් වැලන්ටයින්..

ඇස්වලින් කියාගෙන
"සුදුනෝනේ"
කිස් එකට
හරි ගඳයි
වෛරය..
ජානගත කුහකකම..

"ආදරෙයි"
කීවට හපාගෙන..
කෑදරයට දිරමින්
විෂුවල්..

මිල, කුළ, ජාති
කිය කියා
හිර වී..
ආදරය මැරුවෙම
මග දී..
පණ දෙන්න බැරිවම
විඩාපත්..

] **බුද්ධික සම්පත් - අනුරාධපුර** [

## දාහතර මීටරේට

මුඛ වාඩමට, මීටරයට මුවාව
වැලන්ටයිනුත් ඇවිල්ලා....
අතින් අත අල්ලන්න බැරි
දෙතොල් මත දඟකරනු බැරි
මල් මිටත් සැනිටයිස් කරලා...

වැක්සිනුත් ළඟපාත නැතුවා....
ඔබෙ, මගෙත් රූ ඈත දුටුවා...
මරණයත් එබිකම් කරනදා....
ප්‍රේමයත් හුදකලා කරලා.....

හමුවේවි අපි දාහතර හවසට
මලින් පිරි මාවතක් වෙනුවට
කටු කම්බි හෙමිහෙමින් මතුවන..
පරණ මෝඩකම් මතක් කර කර..

] **ප්‍රශාන් කහගල්ල- රත්නපුර** [

## වැලන්ටයින්

වැලන්ටයින්
නුඹ හිතුවද,
ආදරේට අපි බැන්ඳට
එදා ඉඳන් ගේ පැළකට
ඔට්ටු වුණා මහ ලොකුවට....
අම්මා දුන්න පර්චස් පහ
උගස් කළා මුදලාලිට..
එදා ඉඳල අද වනතුරු
දෑවැද්දට මට බනිනව....
දික්කසාද වෙන්නත් බෑ
නඩු දාන්න සල්ලි කොහිද?
මං යනවා පාරදිගේ
නුඹ ඉඳපන් බංකුව උඩ
තවත් ඒවී මං වගෙ අය.....

] **ගාමිණී දිසානායක - අනුරාධපුර** [



# ආදරේ නැති ලෝකයක ඉඳලා අනාගතය දකින්න බෑ



සාහිත්‍යවේදිනී
ශාන්ති දිසානායක

### ඔබේ සම්පූර්ණ නම?

දිසානායක මුදියන්සේලාගේ ශාන්ති දිසානායක

### ඔබව කොහොම හඳුන්වනවාටද කැමති?

නිදහස සහ සාධාරණත්වය අගයන කාන්තාවක් විදියට

### ස්ථිර රැකියාවක් කරනවද?

ස්ථිර වැටුපක් ලබන්නේ නෑ. නමුත් මගේ ලේඛන වෘත්තිය රැකියාවකුත් වෙලා.

### මේ දවස්වල මොනවද අලුත් වැඩ එහෙම?

"අඳුන්ගිර" තිර පිටපත ලියනවා. ඒ වගේම "ආගාධ" අලුත් නවකතාව එළිදැක්වෙන්න තියෙනවා. තව අලුත් නවකතාවක් ලියමිනුත් ඉන්නවා. ඉඳහිට කවියක් දෙකකුත් ලියනවා.

### මීට කලින් ලියපු නවකතාවලින් ටෙලිනාට්‍ය, චිත්‍රපට එහෙම කරලා තියෙනවද?

ඔව්. "වරාමල්" තමයි මුලින්ම, ඊට පස්සේ වරින් වර මගේ නවකතා පාදක කරගෙන නිර්මාණ බිහිවෙලා තියෙනවා.

### 06. එහෙම දැනට නිර්මාණය වෙලා තියෙන ටෙලිනාට්‍ය චිත්‍රපට, කීපයක් ගැන කියන්න පුළුවන්ද?

"වරාමල්" නවකතාවෙන් "විය සිදුර", "අග්නි" පොතෙන් "කවිය නුඹ" ටෙලිනාට්‍ය, "වර්ණ", "සංග්‍රාමය" නව කතාවෙන් "ධවල දූවිලි" චිත්‍රපටය, " රංකොල්ලා" චිත්‍රපටය, "හිරුමඬල" නව කතාවෙන් "මද්දහන" ටෙලිය, "එරන් ලන්දු" වගේම "පරඬැල්" නව කතාව මේ දවස්වල "සත්රම" නමින් මහව ප්‍රදේශයේ රූගතකිරීම් කරනවා. "වාලුකා" නව කතාවෙන් කරපු "මහපොළොව" ටෙලිය මේ දවස්වල රූපවාහිනියේ විකාශය වෙනවා. තව "ගිරිකුළ", "හැන්දෑව" ටෙලිනාට්‍ය තිබුණා.

### නවකතා ලීවේ ටෙලියක් කරන්න හිතාගෙනමද?

ඔහොම චෝදනාවකුත් මට එල්ල වෙනවා. මම පොත් ලියන්නේ ටෙලිනාට්‍යක් දිහා බලාගෙන කියලා. " වරාමල්" නවකතාව මම ඉදිරිපත් කරේ සාහිත්‍ය තරඟයකට. මම ගැමි පරිසරයට ආස කරපු නිසා තමයි ඒ වගේ කතා ලියැවුණේ. පත්තරවලටත්, උතුරුමැද කලා උළෙලටත් මම ලිව්වා. අනික මගේ පොත්වල අතීතාවර්ජන වැඩියි. චරිත වැඩියි. ඒ නිසා ටෙලියකට, චිත්‍රපටයකට නගන්න අමාරුයි කියලයි මම හිතන්නේ.

### ගිරිදේවි ලංකාවේ ටෙලිනාට්‍ය කලාවට බෝම්බයක් ගැහුවා කියලා සමාජ මාධ්‍යවල ලියන අය සමහර තැන්වල අදහස් දක්වලා තිබුණා. ඔබට ගිරිදේවි කතාවෙන් ඇත්තටම කියන්න ඕනේ වුණේ මොකක්ද?

පසුගිය කාලේ ගබ්සාව නීතිගත කිරීම පිළිබඳව කතා වුණා. ස්ත්‍රී දූෂණයකදී කාන්තාවකට දරුවෙක් ලැබිය හැකි අවස්ථාවකදී දරුවත් මවත්, ජීවිතේ අසරණ වෙනවා. ඒත් ඒ කාරණාව අනුව ගබ්සාව නීතිගත කිරීම පිළිබඳව ආගමික සංස්ථාව ඇතුළු තවත් කණ්ඩායම් දැක්වූ විරෝධය ගැන මට හරිම කේන්තියි. ඒ කේන්තිය තමයි ඇත්තටම ගිරිදේවි බවට පත් වුණේ. ඒත් නවකතාවේ සමහර තැන් ටෙලිනාට්‍යයේදී වෙනස්වෙලා. මට ඕනේ වුණේ නවකතාවේදී "ආශා" සමාජ ශාලාවකට ගිය එකෙන් මේ ප්‍රශ්නය පාඨකයාට සංවේදී කරන්න. නමුත් ඒකෙන් පාඨකයා මට චෝදනා කරනවා ආශා සහ සඳුන් වෙන් කරාය කියලා.

### රොමාන්තික ටෙලිනාට්‍යවලින් තරුණ ප්‍රජාව සිහින ලෝකවල ගිල්වන කාලයක, මිනිස්සු ඇතුලේ ඉන්න ඇත්තම චරිත සහ ඇත්තම ප්‍රශ්න එළියට දැමීම මඟින් කතාවක් විදියට ගිරිදේවී පාඨකයා අතර කතාබහට ලක් වුණා. ඔබට වර්තමාන මෙගා නාට්‍ය හා ටෙලිනාට්‍ය කලාව පිළිබඳව තියෙන්නේ කොහොම අදහසක්ද?

මෙගා හරි කෙටි හරි ටෙලි නාට්‍ය භේදයක් නැතිව දැනගෙන විඳින්න පුළුවන් ටෙලිනාට්‍ය තිබුණා සහ දැනුත් තියෙනවා. ඔෂීන් වගේ හොඳ මෙගා නාට්‍ය අපි බලලා තියෙනවනේ. ප්‍රේක්ෂකයාගේ රසඥතාවයට නිගා කරන, බාල්දු කරන ටෙලිනාට්‍යත් මේ අතර බහුලව තියෙනවා. ඉහළ රසඥතාවයක් තියෙන, දැනෙන, විඳින්න පුළුවන් නිර්මාණත් ඒ අතර බිහි වුණා, බිහිවෙනවා, ඉදිරියටත් බිහිවෙයි.

### මවක්, බිරිඳක්, කාන්තාවක් විදියට ලාංකීය කාන්තා සමාජය ගැන කොහොම ඇගයීමක්ද තියෙන්නේ?

ඇත්තටම මට ලොකු කණගාටුවක් තියෙන්නේ. අද වෙනකොට වැඩිපුරම අධ්‍යාපන ආයතනවල ඉන්නේ, රැකියා කරන්නේ කාන්තාවෝ. ඒත් වැඩියෙන්ම මිත්‍යාව පස්සේ යන්නේත් කාන්තාව. මම මෙහෙම කිව්වට මම ස්ත්‍රීවාදිනියක් නෙවෙයි. මම හිතන්නේ නෑ මේ ක්‍රමය ඇතුලේ කාන්තාව විතරක්ම පීඩාවට පත්වෙනවා කියලා. කාන්තා-පිරිමි භේදයක් නැතිව හැමෝම පීඩාවකින් ඉන්නේ. ඒත් මම හිතනවා අතීත කාන්තාවටත් වඩා වර්තමාන කාන්තාව නොදියුණුයිද කියලා. මොකද අපේ අත්තම්මලා පෝයදාට පන්සල් ගියා. ලිංගිකත්වය, කලාව වගේ දේවල් නිදහසේ වින්ඳා.

### ආශලාගේ සිට සීතම්මලා දක්වා ලක්ෂ ගාණක් මේ වගේ ඛේදවාචකවල ගොදුරු බවට පත්වෙලා තියෙනවා. ස්ත්‍රී දූෂණ, අපචාර වැඩිවෙලා. ආදරය වෙනුවට වෛරය, කුහකකම පිරිලා. ආදරය නැති සමාජයක සිට අනාගත ලෝකය ඔබ දකින්නේ කොහොම ද?

ආදරය නැති ලෝකයක ඉඳලා අනාගතයක් දකින්න බෑ. ජාති, ආගම්, කුළ, මාන මැද්දේ ආදරය, දයාව, කරුණාව මැරිලා. අපි අනිත් හැමදේම දන්නවා. පෙරළි පෙරළී වඳින්න, මිත්‍යාව පස්සේ දුවන්න, ජාති-කුළ හොයන්න, මේ හැමදේම දන්නවා. ඒත් ආදරේ කරන්න දන්නේ නෑ. අපි දැන්වත් ආදරේ කරන්නේ කොහොමද කියලා ඉගෙනගන්න, උගන්වන්න ඕන. මම නම් හිතන්නේ අපේ රටෙන් ආදරය අතුරුදහන් වෙලා වගේ කියලා.

### ඔබ ප්‍රාර්ථනා කරන්නේ කොහොම අනාගත සමාජයක්ද?

මම ලියන දේවල්වලට සල්ලි ලැබුණාට මම ලියන්නේ මේ සමාජය යහපත් කරන අරමුණින්. මේ අප්‍රසන්න ලෝකය අර්ථ විරහිත දේවල් මත්තේ ලේ වගුරවමින්, කඳුලු වගුරවමින් යන ගමන නවත්තන්න ඕන. වඩා යහපත්, යුක්තිගරුක, මිනිසා මිනිසාට ආදරේ කරන ලෝකයක්, මිනිසා ලෝකයට ආදරය කරන සමාජයක් දකින එකයි මගේ හීනය.

### අවසාන වශයෙන් තරුණ ප්‍රජාවට දෙන්න තියෙන පණිවිඩය?

අධ්‍යාපනයත්, තාක්ෂණික දියුණුවත් නිසා මම නම් හිතුවේ ගොඩක් දියුණු, නූතන ඇහැකින් ලෝකය දකින තරුණ ප්‍රජාවක් බිහිවෙයි කියලා. ඒත් අතීතයේදී පවත්වාගෙන ආව ජාති, කුළ, මිත්‍යා මත තරුණ ප්‍රජාවත් කර පින්නාගෙන යාම, ගෝත්‍රවාදී අදහස් දැරීම ගැන මට ලොකු කණගාටුවක් වගේම අනුකම්පාවක් තියෙන්නේ. ඒ වුණත් කලාව, සාහිත්‍ය ඇසුරු කිරීමෙන් මේ තත්වය වෙනස් කරන්න පුළුවන් කියලත් විශ්වාසයක්, බලාපොරොත්තුවක් තියෙනවා.



## ආගම බිහිවීම-04 කොටස

**පසුගිය කලාපය තුළින් අප ඔබ වෙතට ගෙන ආවේ බුද්ධාගම බිහිවීම හා ඒ වන විට ඉන්දියාවේ පැවති සමාජ - ආර්ථික වටපිටාව පිළිබඳවයි. මෙවර ජේසුතුමා සහ කිතුදහමේ උපත පිළිබඳව ගෙන ඒමට බලාපොරොත්තු වෙමු.**

# ක්‍රිස්තියානි දහම

### ප්‍රචණ්ඩත්වය වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදය

පැරණි රෝමයේ ආගම් එම ජනතාවට කිසිදා අධ්‍යාත්මික සතුටක් ලබාදීමට සමත් නොවීය. මිත්‍යා කල්පිත දෙවිවරුන් ඇදහීමෙන් පීඩාවට පත්ව සිටි රෝමවරු ටික කලකට පර්සියානු, ඊජිප්තු සහ වෙනත් පෙරදිග ආගමික වැඳුම් පිදුම් සහ දර්ශනයන් පිළිබඳ උනන්දුවක් දැක්වූහ. එසේ තිබියදී කිතුදහම ඔවුන්ට අධ්‍යාත්මික සංතෘෂ්ටියක් ලබාදීමට සමත් වූ අතර වෙනත් චින්තන රටාවක්ද ඉදිරිපත් කළේය. දෙවියන්ගේ පීතෘත්වය සහ මනුස්ස වර්ගයාගේ සහෝදරත්වය පිළිබඳ අවධාරණය කළ කිතුදහම අවංකත්වය වැනි මනුෂ්‍ය ගුණධර්ම පිළිබඳ ජනතාවට ඉගැන්විය.

**ජේසුතුමා සහ කිතුදහමේ උපත**

යේසුතුමාගේ ජීවිතය පිළිබඳ පැහැදිලි එහෙත් සරල සටහනක් නව තෙස්තමේන්තුවේ පළමු පොත්වල සහ අණපනත් පිළිබඳ පොතෙහි ඇතුළත් වී ඇත. ක්‍රි.පූ. 4 වන සියවසේදී ජෙරුසලම අසල බෙත්ලෙහෙම නම් වූ කුඩා ග්‍රාමයේ යේසුතුමා උපත ලැබීය. යුදෙව් ජාතිකයකු ඔහුගේ පියා නසරත්හි ජෝසප් නම් වූ අතර ඩේවිඩ් රජුගේ පරපුරට අයිති කන්‍යා මරියා ඔහුගේ මව වූවාය. යේසු උපත ලැබූ අවධියේ යුදෙව්වෝ රෝම පාලනයට යටත්ව සිටියහ. රෝමවරයෙකු වූ මහා හීරෝඩ් ක්‍රි.පූ. 73 සහ 4 අතරදී පාලක ජුදෙයා තනතුර දැරුවේය. එකල හීරෝ රජුගේ දූෂිත පාලනය මැද ගැලවුම්කරුවෙක් පැමිණෙන තෙක් ජනතාව බලා සිටි අවධියක් විය. යේසු නසරත් නැමැති කුඩා ගම්මානයේ අවුරුදු 25ට අධික කාලයක් ජීවත් වූයේය. දක්ෂ පුද්ගලයෙකු වූ ඔහුට යුදෙව් පොත්පත්වල තිබුණු දෑ තේරුම්ග ැනීමටත් විග්‍රහ කිරීමටත් හැකියාව තිබුණි. එකල ජුදයි දහම සහ මෝසස්ගේ නීති පිළිබඳව විවිධ අර්ථකථන ඉදිරිපත් වූ අතර ජුදයි දහම තුළද විවිධ මාදිලියේ පරස්පර විරෝධතා තිබුණි.

එවකට ඊශ්‍රායලයේ ප්‍රදේශ පැවතියේ දැඩි මර්ධනකාරී තත්වයකය. යුදෙව් ජනතාව ඒකරාශී කිරීමේ වේදිකාව බවට පත්වූයේ කතෝලික ආගමයි. පාලකයන්ගේ ප්‍රබලත්වය නිසා ඊජිප්තුවේ පාරාවරුන්ට එරෙහිව මෙන්ම රෝම පාලකයන්ට එරෙහිව සන්නද්ධ අරගලයක් කිරීමට නොහැකි තත්වයක් විය. මේ නිසාම යේසුතුමා විසින් පාලකයන්ට එරෙහිව වෙනත් උපක්‍රමයක් එනම් අවිහිංසාවාදී ක්‍රමවේදයක් යොදාගන්නා ලදී. කතෝලික ආගමේ අවිහිංසාව පිළිබඳව මූලික සංකල්පය තුළින් ජනතාව පාලකයන්ගේ මර්ධනයට එරෙහිව ප්‍රජාතන්ත්‍රවාදය සංකල්පය කුළු ගන්වන ලදී. උදාහරණයක් ලෙස යුදෙව් ආගමේ එන ඇසට ඇසක් දතට දතක් ගත යුතු යන අදහසට යේසුතුමා පිළිතුරු දුන්නේ, තමන්ගේ කම්මුලට යම්කිසි කෙනෙක් පහර දුනහොත් අනිත් කම්මුලද හරවන ලෙසයි. නමුත් එය නිවට හැසිරීමක් නොවේ. එය මර්දනයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ හඳුන්වාදීමකි.


යේසුතුමාගේ ඥාති සොහොයුරකු ජෝන් බැප්ටිස් ඔහුගේ ජීවිතය කෙරෙහි බෙහෙවින් බලපා ඇත. පාපකාරී ජීවිතවලින් ඔවුන් මුදවාගැනීම සඳහා ගැලවුම්කරුවෙකු පැමිණෙන බව ජනතාවට දේශනා කළ අය අතර ප්‍රමුඛයා වූයේ මෙම ජෝන් බැප්ටිස්ට්ය. සිය පාප ක්‍රියා ගැන අවංකවම පසුතැවිලි වූ අය බෞතිස්ම කිරීම ඔහු විසින් සිදුකරන ලදී. ජෝන් බැප්ටිස්ට් ක්‍රමයෙන් ජනතාව අතර ජනප්‍රිය වූ අතර ඒ පිළිබඳව ඊර්ෂ්‍යා කළ අධිකාරිය ඔහුව මරා දැමූහ. ක්‍රි.ව. 26 දී යේසුස් තුමාද ජෝන් අතින් බව්තීස්ම ලබා තිබුණි. මෙම බෞතීස්මයෙන් පසුව අලුත් ජීවිතයක් ආරම්භ කළ එතුමා සංචාරක ධර්ම දේශකයෙකු බවට පත්විය. ඔහු තම ජීවිතයේ ඉදිරි කාලය දෙවියන්ගේ පීතෘත්වය පිළිබඳ ඉගැන්වීම් සඳහා කැප කළේය. සාධාරණත්වය, ආදරය, කරුණාව පිරී පවතින දෙවියන්ගේ රාජ්‍ය පිළිබඳව ඔහු දේශනා කළේය. අනුගාමිකයෝ රැසක් ඔහු වටා එක් රොක් වූහ.

අවංකවම තම ඉගැන්වීම්වලට අනුව යමින් ජීවත් වූ ඔහු ඉතා චාම් ජීවිතයක් ගත කළ අතර දුප්පත් ජනතාවට ඔහු බෙහෙවින්ම සමීප වී සිටියේය. රෝගී බවට හෝ පීඩාවට පත්වූ අයට පිහිටවීම සඳහා ඔහු එවැනි අය සොයා ගියේය. ඔහුගේ අනුගාමිකයෝ ඔහු දෙවියන් වහන්සේ විසින් එවන ලද ගැලවුම්කරුවා ලෙස සලකන ලදී. යේසු තුමාද එම තනතුරු නාමය පිළිගත්තේය. ඔහුගේ ඉගැන්වීම්වලින් සමහර යුදෙව් නීති පවා ප්‍රශ්න කරනු ලැබීය. ජනතාව යුදෙව් නීතිවලට අවනතවීම ක්‍රමයෙන් මග හැරවීම සඳහා දේශනා පැවැත්විය.


**යුදෙව් ආගමේ එන ඇසට ඇසක් දතට දතක් ගත යුතු යන අදහසට යේසුතුමා පිළිතුරු දුන්නේ, තමන්ගේ කම්මුලට යම්කිසි කෙනෙක් පහර දුනහොත් අනිත් කම්මුලද හරවන ලෙසයි. නමුත් එය නිවට හැසිරීමක් නොවේ. එය මර්දනයට එරෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ හඳුන්වාදීමකි.**

සිය අධ්‍යාත්මයට අවනත වන ලෙස ඔහු ජනතාවගෙන් ඉල්ලා සිටියේය. යේසුතුමා ජනතාව අතර ජනප්‍රියත්වයට පත්වීම පාලකයන්ගේ සැකයට හා භීතියට හේතු විය. හීරෝ රජු සහ යුදෙව් ආගමික භක්තිකයෝ ඔහු බොරු ශාස්තෘවරයකු ලෙස හෙළා දැක්කහ. ක්‍රි.ව. 30 දී මෙතුමා යුදෙව්වන්ගේ උත්සව අවස්ථාවක ජෙරුසලමට ගිය අතර ඔහුගේ සතුරන්ට ඔහු මරාදැමීම සඳහා කුමන්ත්‍රණය කිරීමට එමගින් මග පෑදුණි. ජේසුතුමාගේ ජනප්‍රියබව ජනතාව අතර කලබල ඇති කිරීමට හේතුවක් වී ඇති බව රෝම පාලකයෝද විශ්වාස කළහ. ඉහත කී උත්සව භූමියේදී ඇතිවූ කලබලයකදී පියතුමා මුදල් මාරු කරන පුද්ගලයෙකුට සහ වෙළඳුන් කිහිපදෙනකුට පහරදීම නිසා ආරක්ෂක නිලධාරීන් විසින් ඔහු අත්අඩංගුවට ගනු ලැබීය. ඔහු මරා දැමීමට පෙර දින රාත්‍රියේ සිය අනුගාමිකයන් සමඟ අන්තිම භෝජනය අනුභව කළ අතර ඒ අවස්ථාවට ජුදාස් ඉස්කැරියොට්ද සහභාගි විය. යේසුස් කවුරුන් දැයි නොදැන සිටි ආරක්ෂක නිලධාරීන්ට ඔහුව හඳුනා ගැනීමට උදව් වීම සඳහා කතිකා කරගෙන තිබූ පරිදි කලබලය සිදුවූ අවස්ථාවේ ජේසුතුමාගේ කම්මුලට හාද්දක් දීමෙන් ජුදාස් එම කුමන්ත්‍රණයට හවුල්කරු වී ඇති බව කියනු ලැබේ.

රෝම අධිරාජ්‍යයට අවමන් කළ බවට චෝදනාකොට යේසුස් අල්ලාගත් යුදෙව්වෝ ඔහු රෝම ආණ්ඩුකාරවරයා වූ පොන්තියස් පිලාත් වෙත භාර දුන්නේය. රෝම පාලකයෝ ඔහුට විරුද්ධව රාජද්‍රෝහී චෝදනා එල්ල කොට ඔහු වැරදිකරු බවට තීන්දු කොට කුරුසියේ ඇණ ගසා මරා දැමූහ. ඉන් දින තුනකට පසුව දිව්‍ය ලෝකය කරා යනු දුටු බව ඔහුගේ ශ්‍රාවකයන් විසින් ප්‍රකාශ කොට ඇත. අභිෂේකලත් යන අර්ථය ඇති ක්‍රිස්තෝස් යන වචනය ඔහු හැඳින්වීමට පටන්ගත් අතර යේසුස්ගේ අනුගාමිකයෝ ක්‍රිස්තියානි ආගම ගොඩනැගුවේ ඔහුගේ ඉගැන්වීම් පදනම් කොටගෙනය.



# මායා ඇන්ජිලෝ



"මේ පෘථිවිය අපට නිර්මාණය කිරීමට බල කර ඇත. සෑම මිනිසෙකුටම, සෑම ගැහැණියකටම, භීතියෙන් තොරව, භක්තියෙන් තොරව නිදහසේ හුස්ම ගතහැකි පොළොවක් ලෙස."

මායා ඇන්ජිලෝ ඇය ඇමෙරිකා එක්සත් ජනපද කලු මිනිසුන්ගේ පුරාවෘත්තයක් වනු නොඅනුමානය. ඇය එක්සත් ජනපද කලු ජාතිකයන්ට කළ මහා මෙහෙවර උදෙසා ඇගේ දූ පුතුන්, ඇගේ මිණිපිරියන් මේ මොහොතේද මායා ඇන්ජිලෝ වෙනුවෙන් වේදිකාවල පෙනී සිටිනු ඇත. බුහුමන් ලබනු ඇත. එහෙත් ඇගේ ජීවිත කතාවේ පළමු පරිඡේද ලියවී ඇත්තේ සුසුමෙනි, කඳුලෙනි, රුධිරයෙනි.

මායා ඇන්ජිලෝට අනුව ඇය සිය ජීවිතයේ උපරිම ලිංගික කෲරත්වය විඳ ඇත්තේ ඇගේ මවගේ පෙම්වතා විසින් ඇයව දූෂණය කරන විටය. එවිට මායාගේ වයස යන්තන් අවුරුදු 7 කි. ඇය ඇගේ ජීවිතයේ සමාජයීය සහාසිකත්වය දැක ඇත්තේ ඇගේ මාමා ඇන්ජිලාව දූෂණය කළ මිනිසාව ඇය එපා යැයි කියද්දී වෙඩි තබා මරණ විටය. එවිටද ඇයට වයස අවුරුදු 7 කි. ඒ වන විට ඇගේ මුල් නාමය මාගරිට් ඇනී ජොන්සන් විය.අවුරුදු 14 වෙද්දී මායා තමන්ගේ උපන් ගම වූ ශාන්ත ලොයිස් අතහැර දා කැලිෆෝනියාවට ගියාය. ඇගේ පළමු රැකියාව ලෙස ට්‍රෑරෑම් කාර් කොන්දොස්තර කෙනෙක් විය. එබැවින් මායා ඇන්ජිලෝ යනු සැන් ෆැන්සිස්කෝවල ට්‍රෑම් රථයක ටිකට් කැඩූ පළමු කලු කාන්තාවයි.. ඉන්පසු ඇය වැඩ කරන්නේ ෆාමසියක බෙහෙත් දෙන කාන්තාවක් ලෙසය. ඈ සමාජශාලා නළඟනක්, ලිංගික කාර්යයට උදව් දෙන ලිංගික සේවිකාවක්ද විය.

මායා රස්සාව කරන ගමන්ම කැලිෆෝනියාවේ සැන් ෆ්‍රැන්සිස්කෝහි ජෝර්ජ් වොෂිංටන් උසස් පාසැලට ඇතුලුවන්නීය. ඇය ඉන් නර්තනය හා නාට්‍යය හදාරයි. වයස අවුරුදු 17ක් වනවිට ඇය ඒ විෂයයේ උපාධිධාරිනියක් විය. මේ කාලයේදී ඇයට ඇමෙරිකානු කලු මිනිසුන් වෙනුවෙන් හඬ නගන ආචාර්ය මාටින් ලුතර් කිං සහ මැල්කම්ව මුණගැසේ. ඒ හමුවීම් ඇගේ ජීවිතයේ ගමන් මාර්ගය වෙනස් කරයි.

ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉමහත් ආන්දෝලනයට ලක්වුණු ඇගේ ප්‍රථම කාව්‍ය ග්‍රන්ථය ඇය නිමා කරන්නේ ඉන් පසුවය. "මම දන්නවා ඇයි කූඩුකළ කුරුල්ලා ගායනා කරන්නේ? " (I Know Why the Caged Bird Sings) එහි ඈ ලියන්නේ මෙසේය. "පටු කූඩුවක පාද බැඳ දැමූ, පියාපත් කපා දැමූ, එක් කුරුල්ලෙක් තමාට බොහෝ ආශාවන් තිබෙන බව කියන්නට ප්‍රථම වතාවට සිය උගුර විවර කරයි."

ඇය 1972දී " ජෝර්ජියා ජෝර්ජියා" නම් චිත්‍රපටියට තිර රචනයක් ලියයි. එනයින්, මායා ඇන්ජිලෝ අමෙරිකානු සිනමා ඉතිහාසයේ ප්‍රථම වරට තිර රචනයක් කළ පළමු කලු ගැහැණිය බවට පත්වේ. එසේම මායා ඇන්ජිලෝ හොළිවුඩ් සිනමාවේ පළමු කලු අධ්‍යක්ෂකවරියද පවා පත්වේ. ඒ ගෞරවය ඇය ලබාගන්නේ 1998දී "Down in the Delta" චිත්‍රපටියෙනි. ලෝක ප්‍රසිද්ධ රූපවාහිනී කතාමාලාවක් වන Rootවල ඇය ප්‍රධාන චරිතයක් බවටද පත්වේ.

ආදරය, ඇය විශ්වාස කරපු එකම දේ විය. නොදැනුවත්කමේ සහ භීතියේ අභ්‍යන්තර යතුර "ආදරය" යැයි ඇය පැවසුවාය. ඒ වෙනුවෙන් සටන් කළාය. මිනිසාට මිනිසා එරෙහි නොවිය යුතුය. ඔවුනොවුන් එකිනෙකා තේරුම් ගත යුතුය. එය කළ හැක්කේ ආදරයෙනි. මායා සිතුවේ එලෙසය. සටන් වැදුනේද ඒ වෙනුවෙන්ය."වර්ගවාදය, ආගම්වාදය සහ ජාතිවාදය වගේ මළජරාව කිසිම කෙනෙක් ගේන්න එපා මගේ ගෙදරට. මොකද මගේ ගෙදර ඒවට ඉඩ නෑ." වරෙක සම්මුඛ සාකච්ඡාවකදී ඈ පැවසුවේ එලෙසය.

ලොවපුරා ඇති ඉහළම විශ්වවිද්‍යාල 50ක් මායා ඇන්ජිලෝ මිනිසාට කළ සේවය වෙනුවෙන් ගෞරව උපාධි පිරිනැමීය. එසේම සිය මහන්සියෙන් තවත් උපාධි සහතික 7ක් ලබාගැනීමටද ඈ සමත්විය. 1975දී ඇමෙරිකා එක්සත් ජනපදයේ Wake Forest විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරිය මායා ඇන්ජිලෝ විය. ඇය මියයන විට ප්‍රකාශයට පත්කර තිබූ පොත් සංඛ්‍යාව 60කට අධිකය. 2000 වර්ෂයේදී එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන් ඇයට කලාව සඳහා වූ ජාතික සම්මානය පිරිනමයි. 2010දී ජනාධිපති බැරක් ඔබාමාද ඇයට එක්සත් ජනපදයේ ඉහළම සිවිල් සම්මානය වන "Medel oF Freedamz" පිරිනමයි. ඇගේ කවියක මෙසේ ඇත. "අපි වැටුනෙමු. එහෙත් ඉතිහාසය කියා සිටී අපි වැටුනද, නැගිටින මිනිසුන් වග! අපි වැටුණද නැගිටි මිනිසුන් වග!!"

] උපාලි ජයසිංහ [

# අධිරාජ්‍ය විරෝධි...

03 පිටුවෙන්...

ඇතිකරන දෙයක් බව ඉතා පැහැදිලියි.

## ව්‍යාජ දේශප්‍රේමීන් සහ අධිරාජ්‍යවිරෝධීන් වෙන වෙනම හඳුනාගන්නේ කොහොමද?

ව්‍යාජ දේශප්‍රේමීන් හා බොරු අධිරාජ්‍ය විරෝධීන් හඳුනාගැනීමට වෙන්නේ ඔවුන්ගේ කතාවලින් නොව ක්‍රියාවලිනුයි. සමහරු, විශේෂයෙන් රාජපක්ෂ කණ්ඩායමේ අය බලය ගැනීම සඳහා පිරුවටක් ලෙස දේශප්‍රේමය, අධිරාජ්‍ය විරෝධය යොදා ගත්තා. ඒත් දැන් බලයට ආවම එම පිරුවට ගලවා දමා නව ලිබරල්වාදය වැළඳගෙන චීනයට, ඉන්දියාවට, එක්සත් ජනපදයට අනුව කටයුතු කරනවා. රටක වරාය, ඉඩම් වැනි වටිනා සම්පත් විදේශ සමාගම්වලට දෙන්න දේශප්‍රේමීන්ට පුළුවන්ද? ඒත් මේ බොරු දේශප්‍රේමීන් එය කරනවා. සැබෑ අධිරාජ්‍ය විරෝධීන් නම්, අධිරාජ්‍යවාදී ආර්ථික ප්‍රතිපත්තිය පවත්වන් යනවද? ඉන්දියාවට යටවෙනවද? ඒත් මේ ආණ්ඩුව මේ සියල්ල කරනවා.

ඉතාම පැහැදිලිව කිව්වොත් මේ වෙලාවෙ නව ලිබරල්වාදී ආර්ථිකය පවත්වන් යන, රට ණයකරන, ණයට හිලව් ලෙස රට විකුණන කිසිවෙකුට දේශප්‍රේමී හෝ අධිරාජ්‍ය විරෝධී වෙන්න බැහැ. සත්‍යය එයයි.

## සැබෑ නිදහස දිනාගනිමින් අධිරාජ්‍යවිරෝධී පාලනයක් ගොඩනැගීම වෙනුවෙන් නූතන තරුණ පරපුරේ කාර්යභාරය කුමක්ද ?

ලංකාවට සැබෑ නිදහස, ජාතික විමුක්තිය දිනාගත යුතුව තිබෙනවා. එය දැන් මේ යල්පැන ගිය ධනපති ක්‍රමය පවත්වාගෙන යන ගමන්, අධිරාජ්‍යවාදී නව ලිබරල් ආර්ථිකය පවත්වාගෙන යන ගමන් කරන්න බැහැ. එම මාවතේ රට ඇදගෙන යන අධිරාජ්‍ය ගැති, පරාධීන ධනේශ්වර කණ්ඩායම්වලට, කොල්ලකාරී ධනේශ්වර කල්ලිවලට රටට සැබෑ නිදහස දිනා දෙන්න බැහැ. ඒ නිසා මේ මොහොතේ ලංකාවේ සැබෑ නිදහස හෙවත් ජාතික විමුක්තිය සමාජවාදයත් සමඟ සම්බන්ධ වෙලා තියෙනවා. නව ලිබරල්වාදය වෙනුවට සමාජවාදී සංවර්ධන මාවත තෝරාග ැනීම තුළ පමණයි සැබෑ නිදහස දිනාගත හැකි වෙන්නේ. ඒ සඳහා වමේ, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී බලවේග පෙළගැසිය යුතුයි. ඒ සඳහා වන විශාලතම මහජන ව්‍යාපාරය නිර්මාණය කළ යුතුයි. රටක් ආර්ථික වශයෙන් නිදහස් වෙන්නේ නැතිව දේශපාලනිකව නිදහස් වෙන්නේ නැහැ. ජන මනස තුළ, සමාජ විඥානය තුළ පරාධීනත්වය වෙනුවට ස්වාධීනත්වය තහවුරු කළ යුතුයි.

මෙහිදී හැමවිටම, ලොවපුරාම පෙරමුණ ගත්තේ තරුණයන්. අලුත් අදහස් තියෙන්නෙ ඔවුන්ට, රැඩිකල් ගතිකත්වය තියෙන්නෙ ඔවුන්ට. අසාධාරණය, අයුක්තිය පිළිකෙව් කරන්නේ තරුණයන්. හැමවිටම විප්ලවකාරී හා සටන්කාමී වෙන්නේ තරුණයින්. ඒ නිසා ලංකාවට සැබෑ නිදහස දිනාගැනීමේ අරගලයේදී, සමාජවාදය සඳහා අරගලයේදී තරුණ පරපුරට පැවරෙන කාර්යභාරය ඉතාම විශාලයි. එම කාර්යභාරය සඳහා වහාම පෙරමුණ ගන්නා ලෙස අපි සමස්ත තරුණ පරපුරෙන්ම ඉල්ලා සිටිනවා.

ඒ පාරෙත් මේ පාරට...

# ‘ජීවත්වීම’ බරක් නොකළ සමාජවාදය



නිවාස, ආහාර, ගෑස්, ජලය, විදුලිය, දුරකතන වැනි අවශ්‍යතා සඳහා ඔබ ඔබේ ආදායමෙන් කුමන ප්‍රතිශතයක් වැයකරනවාද?. අත්‍යවශ්‍ය ද්‍රව්‍යන්ගේ මිල අඩුබව හේතුවෙන් පරිභෝජනයට අමතරව ගබඩාකර තබා ගැනීමට පවා භාණ්ඩ මිලදීගත් ඉතිහාසයක් ඔබට තිබේද???


දියුණු යැයි සම්මත රටවල වැඩකරන ජනතාවට සිය ආදායමෙන් 1/3ක්ම නිවාස සඳහා වියදම් කිරීමට සිදුවූ ධනවාදී ලොවක උක්ත කතාව අරුමයක් නොවූයේ සමාජවාදී සෝවියට් රුසියාවට පමණි.

සමාජවාදී රුසියාවේ ජීවත්වූ කම්කරුවන් හා රාජ්‍ය සේවකයින් නිවාස පහසුකම් සඳහා වෙන්කළේ සිය ආදායමෙන් 1%ක් වැනි ප්‍රතිශතයකි. ගෑස්, ජලය, විදුලිය, දුරකතන වැනි අනෙකුත් වියදම් සඳහාද ඔවුන් දැරුවේ 4%ක් වැනි සුළු මුදලකි. එවන් වූ තත්වයක සමාජවාදී රුසියාවේ ජනතාවගේ ජීවන තත්වය කෙතරම් පහසුවන්නට ඇත්ද? අධික මිල ගණන් නිසා ජනතාවට බඩු මිලදීගැනීමට නොහැකිව එරට වෙළඳසැල්වල රාක්ක පිරී තිබුණේ නැත...ජනගහණයෙන් 10%ක් පමණ කුසගින්නෙන් පෙළෙන අප රට මෙන් එහි ජනතාව කුසගින්නේ සිටියේ නැත...

කොරෝනා වසංගතය හමුවේ 2020 මාර්තු 17 දින අප රටේ ජනපති ‘ජාතිය අමතමින්’ ප්‍රකාශ කළේ සැමන්, පරිප්පු හා බිලූණු මිල පිළිවෙලින් රු.100, රු.65, රු.150ක්ද ලෙස අඩුකරන බවය. ඒ සඳහා පාරිභෝගික අධිකාරියේ ගැසට්පත්‍රයක්ද නිකුත්කළේය. නමුත් මසක් ඉක්මවත්ම එම මිල අඩුකිරීම් අහෝසිකරමින් තවත් ගැසට් පත්‍රයක් නිකුත් කළේය. දැන් සැමන් රු.270ක්ද, පරිප්පු කිලෝවක් රු.185ද වේ. බිලූණු රු.150ටත් එහාය. සුදු/රතු සම්බා සහල් මිල සඳහාද 2019 දෙසැම්බර් සිට නිකුත්කළ ගැසට් පත්‍ර හතරකින් විවිධ මිල ගණන් ඉදිරිපත්කළ අතර ආසන්නතම ගැසට් පත්‍රයට අනුව සම්බා රු.92ක් විය යුතු විය. නමුත් ජනගහණයෙන් 45%කම දෛනික ආදායම රු 1000ටත් වඩා අඩු රටක අද සහල් කිලෝවක්ම රු.127කි.

සැබෑ ලෙසම ජනතාවගේ ආදායම සහතික කරනු ලබන්නේ ප්‍රධාන පාරිභෝගික භාණ්ඩවල මිල ගණන් ස්ථාවර පැවතීමත්, ඇතැම් භාණ්ඩ වර්ගවල මිල ගණන් පහළ දැමීමත්, භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය පහසුකම් නිර්මාණය කිරීමත්, වෙළඳපොළ භාණ්ඩවල සංචිත පවත්වා ගැනීමත් මඟිනි. සමාජවාදී රාජ්‍යයක් වූ රුසියාව 1928 සිට දශක ගණනාවක්ම නිවාස කුලී ඉහළ නොදැමුවේත්, ජනතාවට ‘මතක ඇති කලෙක’ භාණ්ඩ මිල ඉහළ නොදමා තිබුණේත් ජනතාවගේ ජීවිත පහසුකිරීම තකාය. ධනවාදී සමාජ ආර්ථික ක්‍රමය විසින් ජීවත්වීම බරක් කර තිබියදී සමාජවාදය කැපවන්නේ සැමට ප්‍රමුඛව මිනිසාගේ ජීවන තත්වය උසස්කිරීම වෙනුවෙනි.

# ආදරයේ හැඩය තීරණය කරන ජනප්‍රිය සංස්කෘතියේ ටෙලිනාට්‍ය



“තමාම කෙරෙහි වූ ආදරය, දන්නේ එක් බාධකයක් ගැන පමණකි. එනම් අනෙකා පිළිබඳ වූ ආදරයයි, වස්තූන් කෙරෙහි වූ ආදරයයි” සිග්මන් ෆ්‍රොයිඩ් ආදරය ඒ ආකාරයට හඳුන්වයි. අප පෙබරවාරි මස 14 වන දිනය පෙම්වතුන්ගේ දිනය (Valentine’s Day) ලෙස නම් කරනු ලබයි. මෙම දිනයේ ආරම්භය පිළිබඳව පුරාවෘත්තයක සඳහන් වන්නේ, තුන්වන සියවසේදී රෝමයේ වැලන්ටයින් නම් පූජකයෙකු සේවය කළ බවත්, එහිදී රාජ්‍ය පාලකයා වූ දෙවන ක්ලෝඩියස් අධිරාජ්‍යයා, වඩා හොඳ සොල්දාදුවන් ඇති කිරීමට තනිකඩ පුරුෂයන් අවශ්‍ය බව තීරණය කරමින් තරුණයින් සඳහා විවාහය තහනම් කළ බවයි. මෙම නියෝගයේ අයුක්තිසහගත බව වටහාගත් වැලන්ටයින්, අධිරාජ්‍යයාව නොසලකා හරිමින් තරුණ පෙම්වතුන් වෙනුවෙන් රහසිගතව විවාහයන් සිදුකළ අතර සත්‍ය හෙළි වූ වහාම ක්ලෝඩියස් අධිරාජ්‍යයා විසින් ඔහුව මරණයට නියම කරයි.

කෙසේවෙතත් Valentine’s සැමරීමද වෙනත් සියලුම වර්ගයේ උත්සව ලෙසම ධනවාදී පාරිභෝජනවාදයේ ග්‍රහණයට ලක්ව තිබෙනු දක්නට ඇත. ජීවිතයේ ඇති සියලුම ගැටලු සඳහා හේතු වන්නේ පාරිභෝගික භාණ්ඩ වඩ වඩා මිලදීගැනීමට නොහැකි වීම බව පුද්ගලයා සිතයි. මේ නිසා ඔවුන් දිවා රෑ නොබලා මුදල් ඉපයීමට වෙහෙසෙයි.

පරිභෝජනය එක් වටයකින් සම්පූර්ණ වන ක්‍රියාවක් නොවේ. සමකාලීන පරිභෝජනවාදී සංස්කෘතිය සැබෑ මානව පරිභෝජන අවශ්‍යතාවයන්ගෙන් මිදී මේ වන විට පුද්ගලයාගේ ද්‍රව්‍යාත්මක අර්චනය යන අන්තය තුළ ස්ථානගත වී ඇත. මෙය පෙම්වතුන්ගේ දිනය සැමරීමට පමණක් සීමා වූවක් නොව, රූපවාහිනී නාලිකා විසින් විකාශය කරන ආදරය අර්ථකථනය කිරීමට උත්සාහ කරන ටෙලිනාට්‍ය තුළද දැකිය හැක.

රූපවාහිනී නාලිකාවක් විසින් මෑතකදී විකාශනය ඇරඹූ “පොදු” නම් වූ ටෙලිනාට්‍ය සඳහා බොහෝ ප්‍රේක්ෂකයින් ආකර්ෂණය විය. මෙහිදී “පොදු” යන්න රැඩිකල්, සාමූහික මෙන්ම සුභසාධනවාදී අදහසක් ප්‍රකට කළද මෙම ටෙලිනාට්‍ය සඳහා මෙවැනි නාමයක් අදාළ වන්නේ කෙසේද යන්න ගැටලු සහගත වේ. ටෙලිනාට්‍ය මඟින් විශ්වවිද්‍යාලයක තරුණ යුවලක් අතර ගොඩනැගෙන ප්‍රේම සබඳතාවයක් ගෙනහැර දක්වයි.

මෙම ටෙලි නාට්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන යන ප්‍රචාරණ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස මෙය එදිනෙදා ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කරවයි. තාරුණ්‍ය හා ගොඩනැගුණු සිහින, ලාලසාවන් යොදාගන්නා නාට්‍ය පුරාවටම දක්නට ලැබෙන්නේ නාට්‍යයේ ආකර්ෂණය ඉහළනැංවීම සඳහා භාවිතා කරන ප්‍රයෝගවලට වඩා වැඩියමක් නොවේ. උදාහරණයක් ලෙස ඔවුන් රණ්ඩු කරගනී. ඒත් ඒවා කිසිදු තර්කානුකූල බවක් නොමැති රූපරාමු බව ඕනෑම කෙනෙකුට වැටහී යයි. ඒවාගේම රැඩිකල් විශ්වවිද්‍යාල තාරුණ්‍ය නිරූපණය කරනවා යැයි පෙන්වීමට උත්සාහ කළත් ඒ පිළිබඳව අදහසක් පවා නොමැතිව, යථාර්ථයෙන් බොහෝ ඈත රූප රාමු අප වෙත ගෙන යයි. මාධ්‍ය ආචාරධර්ම පවා නොතකමින් විකාශනය වීම නාට්‍යයේ ආකර්ෂණය ඇති කිරීමට විනා නිර්මාණාත්මකභාවය ඉහළනැංවීම සඳහා සිදුකරන ලද්දක් නොවන බව පැහැදිලි වේ.

මෙහි වන ප්‍රධානම විවාද සම්පන්න කාරණාව ලෙස මා දකින්නේ සුන්දර සුකුමාල ස්ත්‍රිය සහ කාය ශක්තියෙන් හෙබි පුරුෂයා නිරූපණය කිරීම තුළින් පෙනී සිටින පුරුෂමූලික මෙන්ම අධිපතිවාදී දේශපාලනය නඩත්තු කිරීමයි. උදාහරණයක් ලෙස අපේ කාලයේ පෙම්වතෙක් වෙන්න නම් හොඳට ගහගන්න පුළුවන් හයිය තියෙන්න ඕන, පෙම්වතියක් නම් ඒ ගහේ එතෙන්න හොඳ වැලක් වෙන්න ඕන යනුවෙනි. කෙනෙකුට මෙසේ තර්ක කළ හැක. මහාකවි කාලිදාසගේ සකුන්තලා නාට්‍යයේත්, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ මනමේ නාට්‍ය තුළත් ප්‍රේමවන්තයා සහ ප්‍රේමවන්තිය නිරූපණය වන්නේ ඉහත කී ආකාරයට නොවේ දැයි යනුවෙනි. නමුත් මෙම ටෙලිනාට්‍යයේ ආකෘතිය රැඩිකල් සමකාලීන තාරුණ්‍ය නියෝජනය කිරීම ලෙස කියමින්, එහි අන්තර්ගතය සාම්ප්‍රදායික අධිපතිවාදී කලාවේ කතිකාමය දිගුවක් නම් රොමෑන්තික නොවන ආදරය ප්‍රකාශ කිරීම් රැඩිකල් වන්නේ නැත. එවැනි නිර්මාණයක අවසාන ප්‍රතිඵලය වන්නේ සෑමවිටම විකෘතියකි.

පරිභෝජනවාදය යනු දෘෂ්ටිවාදයකි. ඇතැම් විට පවත්නා දෘෂ්ටිවාදයන් ප්‍රශ්න කරමින් ඒවාට අභියෝග කරන ටෙලි නාට්‍යක් ජනප්‍රිය වෙළෙඳ නාලිකාවකින් බලාපොරොත්තු වීමම ඵල රහිතය. එහෙත් මෙවැනි ටෙලි නාටක මඟින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය, තාරුණ්‍ය, ආදරය වැනි සියුම් හැඟීම්වල පවා දිග පළල තීරණය වීම කණගාටුවට කරුණකි.

කෞෂල්‍යය කුමාරසිංහ සහ විදුර ප්‍රභාත් මුණසිංහ විසින් ප්‍රේමය පසසනුවස් නමින් පරිවර්තනය කරන ලද ඇලන් බදිව්ගේ In Praise of Love නම් කෘතියේ ප්‍රේමය ගැන සඳහන් වන්නේ මේ ආකාරයෙනි.

“ප්‍රේමය නිශ්චිතවම සංයුක්ත වන්නේ මේ මොහොත තුළ අනන්‍ය වන්නා වූ වෙනස්කමක විරුද්ධාභාසය තුළයි. අපගේ වෙනස්කමේ ප්‍රීතිමය තුළින් ලෝකයේ සමස්ත දර්ශනය දකින මේ අද්විතීය ප්‍රේමයේ විෂය තුළට මම සහ ඇය දැන් අන්තර්ගත කරනු ලැබ තිබෙනවා. ඉතින් දැන් මේ ලෝකෙ තේරුම් ගත හැකිය. මේ ලෝකයට නැවත ඉපදිය හැකියි”.

] චාමනී දර්ශිකා [

කරක් ගහපු තැන



# ගල් පාලම්

අපි මෙතෙක් කල් ඔබ වෙත ගෙන ආවේ ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්වභාවධර්මයාගේ විශ්මිත නිර්මාණයන් පිළිබඳවයි. මානව ශිෂ්ටාචාරයේ දියුණුවේ විකාශනය පෙන්නුම් කරන, මානව ශ්‍රමයේ වැදගත්කම කියාපාන ඓතිහාසික ස්ථාන කරා මෙවර ඔබව රැගෙනයාමට සිතුවෙමු.

අපගේ ශිෂ්ටාචාරය ජලය ඇසුරු කරගෙන ගොඩනැගුණු බැවින් ජලාශ්‍රිත ශිෂ්ටාචාරය යනුවෙන් ව්‍යවහාරයට ලක්වූ බව කවුරුත් දන්නා කරුණකි. ඒ ශිෂ්ටාචාරය ගොඩනැගීමේදී වාරි තාක්ෂණය, ඉදිකිරීම් තාක්ෂණය ආදී වර්තමාන භෞතික විද්‍යාව පවා මවිත කරවන ඉදිකිරීම් පැරැන්නෝ නිර්මාණය කර තිබුණි. කෙසේ නමුදු වාරි තාක්ෂණය, ගොඩනැගිලි ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳව සැසඳීමේදී මාර්ග තැනීම පිළිබඳව සඳහන් වී තිබෙන්නේ අඩු වශයෙනි.

පාලම් නිර්මාණය වන්නේ ජල පහරවල් මතින් වන අතර වර්තමානය වන විට මාර්ග හරහාද ඉදිවෙමින් පවතී. 'ගුවන් පාලම්' ලෙස හැඳින්වෙන්නේ ඒවාය. මාර්ග ඉදිකිරීමේදී ජල දහරාවක් මගහැර යා නොහැකි අවස්තාවලදී පාලම් ඉදිකිරීම අත්‍යවශ්‍යම කරුණකි. ඉදිකිරීම සිදුවන්නේ ජල පහරේ ස්වභාවයද ඒ මත සිදුවන ගමනාගමනයද සැලකිල්ලට ගනිමිනි.

පාලම්වල මුල් අවධිය 'ඒදඬු' ලෙස හඳුනාගත හැක. කල් පැවත්ම පිළිබඳව සලකා බලමින් පසු කාලීනව පාලම් ශිලා ස්ථම්භ ආධාරයෙන් ඉදිකිරීම සුවිශේෂීතාවයකි.

පැරැන්නන්ගේ විශිෂ්ටත්වය පිළිබිඹු වන මෙවැනි 'ගල් පාලම්' කිහිපයක් අනුරාධපුර නගරය අවට දැකිය හැකිය. මහකනදරාව, මල්වතු ඔය හරහා මෙන්ම තවත් ස්ථානවල ඉදි කොට ඇති ගල් පාලම් කිහිපයක් වර්තමානය වන විට ශේෂව පවතී. 'ශිලා සේතු' නමින් මහාවංශයේ සඳහන් වන්නේ එලෙසින් ඉදිකරන ලද ගල් පාලම්ය.

### මල්වතු ඔයේ ගල් පාලම

මල්වතු ඔය හරහා ඉදිකරන ලද ගල් පාලමක නටබුන් කිරිබත් වෙහෙරට පිවිසෙන මාර්ගයේ දක්නට ලැබේ. සමාන්තරව විහිදෙන පරිදි ගල් කණු දෙක බැගින් සිටුවා ඒ මත හරස් අතට බාල්ක යොදා එම බාල්ක මත මට්ටම් කළ ගල් පුවරු යොදා තිබේ. දැනට ඉතිරි වී ඇති කොටසෙහි පුවරුවල ප්‍රමාණය හා හරස් අතට යොදා ඇති බාල්කයන්හි දිග සැලකීමේදී ගල් පුවරු 7ක් බාල්ක මත තබා ඇති බවට අනුමාන කළ හැකිය. ගල් පුවරුද සමඟින් සමන්විත හොඳින් සංරක්ෂිත කොටස මල්වතු ඔයට මෙපිටින් දැකිය හැකි අතර සංරක්ෂණය නොකළ කොටස ඔය මැද දක්නට ලැබේ.

### හාල්පානු ඇළ ගල් පාලම

මල්වතු ඔය හරහා ඉදිකර ඇති ගල් පාලමට පිවිසෙන මාර්ගයේ ප්‍රමාණයෙන් කුඩා තවත් ගල් පාලමක් දැකිය හැකිය. හාල්පානු ඇළ හරහා නිර්මාණය කර ඇති බැවින් හාල්පානු ඇළ ගල් පාලම නමින් සංචාරකයන් අතර ප්‍රකටය. මල්වතු ඔයේ ගල් පාලම තරම් විශාල නොවූ මෙය නිර්මාණයේදී භාවිතා කළ ගල් පුවරු මල්වතු ඔයේ පාලම මත අතුරා ඇති ගල් පුවරුවලට වඩා සුමට බවින් යුක්තය. ගල් පුවරු හතක් බාල්ක මත අතුරා තිබේ. ඇළ මධ්‍යයට වන්නට ඇති ගල් පුවරු කඩා වැටී ඇති අතර සංරක්ෂණයක අවශ්‍යතාවය මතුව ඇති බවට එය නරඹන ඕනෑම කෙනෙකුට අවබෝධ වනු නොඅනුමානය.

] ගයාන් තුදුස්ක [

## මේ රටේ තරුණ තරුණියන්ට අවශ්‍ය හමුදා පුහුණුවක් නොවෙයි...




වයස අවුරුදු 18 ඉක්මවූ සියලු පුද්ගලයින්ට හමුදා පුහුණුව ලබාදෙන බව, මහජන ආරක්ෂක ආමාත්‍ය සරත් වීරසේකර අමාත්‍යවරයා ජනවාරි 18 දා කළ ප්‍රකාශයට විරෝධය දක්වමින් සමාජවාදී තරුණ සංගමය විසින් පසුගිය මාධ්‍ය හමුවක් පැවැත් විය. එහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා විසින් අදහස් දක්වමින් කියා සිටියේ "සමාජවාදී තරුණ සංගමය හැටියට අපි විශ්වාස කරන්නේ මේ රටේ තරුණ තරුණියන්ට අවශ්‍ය හමුදා පුහුණුවක් නොවෙයි. හමුදාමය අවශ්‍යතාවයන් වෙනුවෙන් එම ව්‍යුහයන්, නීතිපද්ධති, සහ ආචාරධර්ම හැදිල තියෙන්නේ යුධමය වටපිටාවක් ඇතුළේ. අපේ රටේ තරුණ තරුණියෝ හමුදාමය පුහුණුවකට සූදානම් වෙන්න ඕන කියලා අපි විශ්වාස කරන්නේ නෑ. අපේ තරුණ තරුණියන් ඇතුළු ජනතාව යොමු කරන්න ඕනෑ මිනිසෙකුට මිනිසෙකු ආදරේ කරන තැනකට" යන්නයි.

## විරදගොල්ලෑව රක්ෂිතයත් ඩෝසර් කරයි...



අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විරදගොල්ලෑව රක්ෂිතයට අයත් පහල අඹතලේ ගම්මානයට යාබදව වර්තමාන ආණ්ඩුවේ දේශපාලන හිතවතෙක් විසින් වනාන්තරය කපා වගාකටයුතු කරමින් ඇත. මේ පිළිබඳව පහල අඹතලේ පැරකුම් ගොවි සංවිධානය බලධාරින්ගේ අවධානය යොමුකළත් බලධාරීන් මුනිවත රකින්නේ වර්තමාන ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙකුගේ බලපෑම නිසා බව ගම්මුන් චෝදනා කරනවා.

මේ පිළිබඳව සොයාබැලීම සඳහා පසුගිය 12 දින සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික සංජය විශ්වනාත් සහෝදරයා, ජ.වි.පෙ. තිරප්පනේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී රෝහණ විජේතිලක සහෝදරයා, පහල අඹතලේ පැරකුම් ගොවි සංවිධානයේ නියෝජිතයින් සහ ප්‍රදේශවාසීන්ද සමඟ එම ස්ථානයට ගියහ.

## වරාය අයිතිය විදේශ රටවලට විකිණීම හෙලා දකිමු!




කොළඹ වරායේ නැගෙනහිර ජැටිය ඉන්දියාවේ අදානි සමාගමට විකිණීමට විරෝධය දක්වමින් පසුගිය ජන. 12 වන දින ජනතා විමුක්ති පෙරමුණ විසින් සංවිධානය කර තිබූ විරෝධතාවයට සමාජවාදී තරුණ සංගමයද තම සහයෝගය දක්වමින් එම අවස්ථාවට සහභාගි විය.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.